
# රණවිරුවා

2024 මැයි • 266 කලාපය





ලොව්තුරු සුවයෙන් සවිසත සැනහුණු

**පින්බර වෙසඟක් වේවා !**

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# 2024 "බුද්ධ රශ්මි" වෙසක් කලාපය

කොළඹ, හුණුපිටිය ගංගාරාම විහාරස්ථාන සීමාමාලක පරිශ්‍රයේදී පැවති 2024 "බුද්ධ රශ්මි වෙසක් කලාපය", පසුගිය මැයි මස 23 වන දින සන්ධ්‍යාවේ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ සුරතින් විවෘත කෙරිණි. මෙම අවස්ථාව සඳහා මහා සංඝරත්නය ප්‍රමුඛ ජනාධිපති ලේකම්, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන් සහ විදේශීය නියෝජිතයෝ රැසක් ද සහභාගී වූහ.



බුද්ධ රශ්මි වෙසක් කලාපයේ ආරම්භය සනිටුහන් කරමින් අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් විදුලි බුබුළු දැල්වීමෙන් අනතුරුව ෂැංග්‍රිලා හෝටල් පරිශ්‍රයේදී පැවැත්වූ දන්සැල සහ එම පරිශ්‍රයේ පැවති වෙසක් කලාපයේ නිර්මාණයන් ද විවෘත කෙරිණි. පසුව, යුද්ධ හමුදා භටපිරිස් විසින් ඉදිකරනු ලැබූ "වංකගිරිය" යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් විවෘත කරනු ලැබීය. "වෙස්සන්තර රාජ මාලිගාව" සහ "වංකගිරිය" තේමාව ඔස්සේ යුද්ධ හමුදාධිපතිතුමන්ගේ මගපෙන්වීම යටතේ ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස් මෙම නව නිර්මාණය ඉදිකරනු ලැබූහ.



## "දියවන්නා වෙසක් කලාපය"

ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව සහ ස්වාධීන රූපවාහිනී ජාලය ඒකාබද්ධව සංවිධානය කරනු ලැබූ 2024 "දියවන්නා වෙසක් කලාපය" පසුගිය මැයි මස 23 වන දින පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා මහා සංඝරත්නය ප්‍රමුඛ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.



ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ නිර්මාණාත්මක හැකියාවන් එළිදක්වමින් ඉදිරිපත් කරනු ලැබූ වෙසක් පහන් කූඩු සහ අනෙකුත් නිර්මාණ බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත සහ ආරක්ෂක අමාත්‍යාංශ මාර්ගය ආවරණය කරමින් පැවති මෙම වෙසක් කලාපය තුළ ප්‍රදර්ශනය කරනු ලැබීය. උත්සවයේ වර්ණවත් බව තවදුරටත් වැඩිකරමින් ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් භක්ති ගීත වැඩසටහනක් ද පැවැත්විණි.









# ජාතික වෙසක් උත්සව සැමරුම මාතලේදී





ජාතික වෙසක් උත්සවය ඉකුත් මැයි මස 23 වන දින බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මාතලේ දී පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා මහා සංඝරත්නය, මධ්‍යම පළාත් ආණ්ඩුකාර, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ඇතුළු සම්භාවනීය පිරිසක් ද සහභාගී වූහ. මෙම අවස්ථාවට සහභාගී වූ විදේශීය නියෝජිතයින් විසින් යුද්ධ හමුදාධිපති වෙත විශේෂ සමරු තිළිණ කිහිපයක් ද ප්‍රදානය කරන ලදී.

# ගාලු මුවදොර වෙසක් භක්ති ගී ප්‍රසංගය





ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ගාලු මුවදොර වෙසක් කලාපයේදී පවත්වනු ලැබූ "වෙසක් භක්ති ගීත - 2024" වැඩසටහනේ තෙවන අදියර පසුගිය මැයි මස 25 දින පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා ජනාධිපති ලේකම් ඊ.එම්.එස්.බී. ඒකනායක, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ද සහභාගී වූහ.

# 17 වන බුද්ධ රශ්මි බැති ගී



17 වන "බුද්ධ රශ්මි බැති ගී" වැඩසටහන කොළඹ, බුද්ධ රශ්මි වෙසක් කලාපයේදී පසුගිය මැයි මස 26 වන දින සන්ධ්‍යාවේ පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා ද මහා සංඝරත්නය ප්‍රමුඛ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ත්‍රිවිධ හමුදාධිපතිවරු, බස්නාහිර පළාතභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ඇතුළු විශාල බැතිමතුන් පිරිසක් සහභාගී වූහ.

හුණුපිටිය ගංගාරාම විහාරාධිකාරී ආචාර්ය පූජ්‍ය කිරින්දේ අස්සජි හිමිපාණන් ප්‍රමුඛ සම්භාවනීය ආරාධිත අමුත්තන් සමඟ ඇරඹි මෙම වැඩසටහනට භක්ති ගීත සහ නාට්‍ය අංග රැසක් ඇතුළත්ව තිබිණ. යුද්ධ හමුදාධිපතිතුමන් ප්‍රමුඛ ආරාධිත අමුත්තන්ගේ සුරතින් බුද්ධ රශ්මි වෙසක් පහන් කූඩු තරගයේ විවෘත අංශයේ ප්‍රථම ස්ථාන තුන දිනාගත් සාමාජිකයන් වෙත සහතිකපත් සහ මූල්‍යමය දීමනාවන් පිරිනැමීම ද එහිදී සිදුකෙරිණ.

# වෙසක් පොහොයට සමගාමීව දන්සැලක්



වෙසක් පුර පසළොස්වක පොහොය දිනයට සමගාමීව බත් දන්සැලක් සහ අයිස්ක්‍රීම් දන්සැලක් පසුගිය මැයි මස 24 වන දින දියවන්නා වෙසක් කලාපයේ දී පැවැත්විණ. යුද්ධ හමුදා මූලස්ථානයට ගමන් ගන්නා මාර්ගය ආරම්භ වන ස්ථානය අසලදී පැවති මෙම දන්සැලට යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ද එම සේවා වනිතා ඒකක සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# ශ්‍රී ලංකා සේවා මුක්ත භටසංගමයට නව මූලස්ථාන ගොඩනැගිල්ලක්

කොළඹ, ශ්‍රී ජයවර්ධනපුරදී ස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා සේවා මුක්ත භටසංගමයේ (SLESA) නව මූලස්ථාන ගොඩනැගිල්ල, සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය මැයි මස 22 වන දින විවෘත කරනු ලැබීය.



මෙම උත්සව අවස්ථාවට ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී, ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් උදේනි රාජපක්ෂ ආර්එස්පී වීඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.



එසේ විවෘත කරනු ලැබූ මෙම සේවා මුක්ත භටසංගම් නව මූලස්ථාන දෙමහල් ගොඩනැගිල්ල සම්මන්ත්‍රණ ශාලාවක්, සමාජ ශාලාවක්, නිවස්නයක් සහ කාර්යාල සංකීර්ණයකින් සමන්විත වේ.

මෙහි ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාවේ භටපිරිස් විසින් සිදු කරන ලදී. ශ්‍රී ලංකා සේවා මුක්ත භටසංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑම්යූආර් පෙරේරා (විශ්‍රාමික) ගේ ඇරයුමෙන් එහි පැමිණි ජනාධිපතිතුමන් එම උත්සවයට පැමිණ සිටි පිරිස ආමන්ත්‍රණය කරන්නට ද කටයුතු කළේය. සේවා මුක්ත භට සංගමයට ඉතිහාසයේ පටන් තිබූ විශාල අඩුපාඩුවක් සපුරාලමින් මෙම අභිමානවත් නිවහන ඉදිවිය.



# 15 වන රණවිරු අනුස්මරණ දිනය අභිමානවත්ව













කුරිරු ත්‍රස්තවාදයෙන් මව්බිම මුදාගැනීම සඳහා දිවිපිදූ විරෝදාර රණවිරුවන් 28,619 දෙනෙකු සිහිකිරීම වෙනුවෙන් පුෂ්පෝපහාර පුදකිරීමේ 15 වන රණවිරු අනුස්මරණ දිනය හෙවත් "විජයග්‍රහණයේ දිනය" 2024 මැයි මස 19 වන දින බත්තරමුල්ල ජාතික රණවිරු ස්මාරකය අභියසදී පැවති අතර, එම උත්සව අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් සහභාගී වූවේය.

වර්ෂ 2009 මැයි මාසයට පෙර පැවති කුරිරු යුද්ධයේදී මාතෘභූමියේ ඒකීයභාවය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම උදෙසා යුද්ධ හමුදාවේ 23962 ක්, නාවික හමුදාවේ 1160 ක්, ගුවන් හමුදාවේ 443 ක්, පොලිස් නිලධාරීන් 2598 ක් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 456 දෙනකු ඇතුළු දේශප්‍රේමී විරෝදාර රණවිරුවන් සිය ජීවිත පූජාකරනු ලැබූ අතර එම විරෝදාර රණවිරුවන්ගේ වීරත්වය, පරාර්ථකාමීබව සහ උත්තරීතර කැපකිරීම වෙනුවෙන් මෙම උත්සවයේදී පුෂ්පෝපහාර පුදකර ඔවුන් වෙත ගෞරවාචාරය දැක්විය.

රණවිරු සේවා අධිකාරිය මගින් සංවිධානය කරනු ලැබූ මෙම උත්සවයේදී දිවංගත විරෝදාර රණවිරුවන් වෙත පුෂ්පෝපහාර පුදකිරීම සඳහා එම රණවිරුවන්ගේ දෙමාපියන්, භාර්යාවන්/ළඟම ඥාතීන්, භික්ෂූන් වහන්සේලා, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක, රාජ්‍ය නිලධාරීන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, වත්මන් ත්‍රිවිධ හමුදාධිපතිවරු, හිටපු ත්‍රිවිධ හමුදාධිපතිවරු, පොලිස්පති හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, රණවිරු සේවා අධිකාරියේ සභාපති ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වූහ.





# විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සුබසාධන හා පරිපාලන කටයුතු පිළිබඳ සොයාබැලේ



දඹුල්ල සහ ගලේවෙල ප්‍රදේශයේ විශ්‍රාමික රණවිරුවන් සහ ඔවුන්ගේ සමීපතම ඥාතීන් 500 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් ඔවුන්ගේ සුබසාධන හා පරිපාලන කටයුතු සොයා බැලීම වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහනක් 53 වන පාබල සේනාංක මූලස්ථානයේදී පසුගිය මැයි මස 11 වන දින පැවැත්විණ.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහනට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ද එක්වූහ.



විශ්‍රාමික රණවිරුවන්ගේ පරිපාලනමය ගැටලු සහ ඔවුන්ගේ සුභසාධන කටයුතු පිළිබඳව මෙහිදී අවධානය යොමුවිය. වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂක මණ්ඩලය, යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂක මණ්ඩලය, පිරිස් පරිපාලන අධ්‍යක්ෂක මණ්ඩලය, නීති සේවා මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂක මණ්ඩලය, සුභසාධක අධ්‍යක්ෂක මණ්ඩලය, රණවිරුසේවා සහ පුනරුත්ථාපන අධ්‍යක්ෂක මණ්ඩලය සහ යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂක මණ්ඩලය යන අධ්‍යක්ෂක මණ්ඩලවලට ඔවුන්ගේ ගැටලු යොමුකිරීම සඳහා උපකාරක විමසීම් ස්ථාන හතක් ද තිබීම එහි විශේෂත්වයකි. රණවිරුසේවා සහ පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්සී ඒකනායක ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් මෙම කටයුත්ත සංවිධානය කෙරිණ. මව්බිම වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා අතින් වියළි සලාක ඇසුරුම් සහිත පාර්සල් 81 ක් බෙදාදීමද එහිදී සිදුවූ අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් එය සංවිධානය කරන ලදී.












# කෘත්‍රිම අත් පා නිෂ්පාදන වැඩසටහනක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ මෙරට ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ද්විපාර්ශ්වික සහයෝගීතාවයෙන් යුතුව රාගම රණවිරු සෙවණ සුවතා නිකේතනයේදී කෘත්‍රිම අත් පා නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙමගින් දෙරටෙහි සුහදතාවය වර්ධනය කිරීම මෙන්ම ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඇති ශක්තිමත් බැඳීම සංකේතවත් කිරීමද තම ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් කැප වී රණක්ෂිතයට පත් වීම නිසා අභියෝගවලට මුහුණ දුන් වීරෝදාර රණවිරුවන්ට සහය වීමද අපේක්ෂා කෙරේ.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ මෙම උත්සව අවස්ථාවට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා *(Santosh Jha)*, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ රාගම රණවිරු සෙවණ සුවතා නිකේතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩීඑම් කුමාරසිංහ ආර්එස්පී ද සහභාගී වූහ.

මෙම ව්‍යාපෘතිය, කෘත්‍රිම අත් පා නිෂ්පාදනය කිරීම සඳහා විශේෂඥ දැනුමකින් යුත් ඉන්දියාවේ ප්‍රසිද්ධියට පත් ජයිපූර්හි පිහිටි ශ්‍රී භගවාන් මහාවීර් විකලාංග සහය කමිටුවේ *(Shree Bhagwan Mahaveer Viklang Sahayata Samiti)* ඉන්දියානු ජාතිකයින් 08 දෙනකුගේ සහභාගීත්වයෙන් මැයි මස 03 වන දින ආරම්භ විය. මෙම වැඩමුළුව මගින් යුද්ධ හමුදා සාමාජිකයන් 375 ක්, නාවික හමුදා සාමාජිකයන් 25 ක්, ගුවන් හමුදා සාමාජිකයන් 25 ක් සහ පොලිස් නිලධාරීන් 25 ක් වෙනුවෙන් කෘත්‍රිම අත් පා ලබාදීම අරමුණ වේ. එසේම සිවිල් වැසියන් 200 දෙනකුටද මෙම උපකරණ බෙදාදීමට සැලසුම් කර ඇත.





# දීඝවාපිය පුදබිමේ ප්‍රතිසංස්කරණ කටයුතු නිරීක්ෂණය කෙරේ

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), යුද්ධ සහ ගුවන් හමුදාධිපතිවරු ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසක් ඉකුත් මැයි මස 30 වන දින දීඝවාපිය සහ නීලගිරිය පුදබිමේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණය කිරීමේ සංචාරයක නිරතවූහ.



එහිදී, ත්‍රිවිධ හමුදා සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටපිරිස් එම විහාරස්ථාන පරිශ්‍රයන්හී ඉදිකරනු ලබන ධාතු මන්දිරය, වන්දනාකරුවන්ගේ විවේකාගාරය සහ සංඝාවාසයේ ඉදිකිරීමේ කටයුතු පිළිබඳ නිරීක්ෂණය කරමින් කැණීම් කටයුතු සිදුකරන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟින් සුහද අදහස් හුවමාරුවක ද නිරතවූහ.



අම්පාර ප්‍රදේශයේ සංචාරයෙන් අනතුරුව පොතුවිල්, සෙංගමුව නීලගිරි විහාරස්ථානය වෙත සපැමිණි එම ජ්‍යෙෂ්ඨ නිලධාරීහු ශ්‍රී ලංකා ගුවන් හමුදා භටපිරිස් විසින් මේ වනවිට එම විහාරස්ථානයේ සිදුකරනු ලබන ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව ද සොයා බැලූහ.

# ලෝක ශූරතාවලියේ විශිෂ්ටයෝ යුද්ධ හමුදාධිපතිගේ ඇගයුමට



ජපානයේ පැවති "කෝබේ" 2024 පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලියේදී පැරා මලල ක්‍රීඩා ඉසව් සඳහා සහභාගී වී විශිෂ්ට දක්ෂතා දැක්වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බලලත් නිලධාරී II සමිත දුලාන් කේඒ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ මාණ්ඩලික සැරයන් පාලිත බණ්ඩාර එච්ජී, ඉකුත් මැයි මස 27 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ.



මව්බිමටත් යුද්ධ හමුදාවටත් අභිමානයක් ගෙනදුන් මෙම ක්‍රීඩකයින්ගේ දක්ෂතාවයන් පිළිබඳ ඇගයීමට ලක්කළ යුද්ධ හමුදාධිපති එම ක්‍රීඩකයින් දෙදෙනා වෙත විශේෂ සමරු තිළිණ සහ මූල්‍ය දිරිදීමනා පිරිනමමින් ඔවුන්ගේ ඉදිරි ක්‍රීඩා කටයුතු සඳහා සිය සුභාශිංසන එක්කළේය. මෙම අවස්ථාවට ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඒටී ගොඩේවත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ද සහභාගී විය.

ජපානයේ පැවති "කෝබේ" 2024 පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලියේදී බලලත් නිලධාරී II සමිත දුලාන් කේඒ F -44 කාණ්ඩයේ පැරා හෙල්ල විසිකිරීමේ තරගය සඳහා සහභාගී වී මීටර් 66.49 ක දුරක් වාර්තා කරමින් ලෝක වාර්තාවක් පිහිටවූ අතර, F-44/F-64 කාණ්ඩ යටතේ රිදී පදක්කමක් ද දිනාගත්තේය. එමෙන්ම, එම තරගාවලියේදී මාණ්ඩලික සැරයන් පාලිත බණ්ඩාර එච්ජී යගුලිය විසිකිරීම ඉසව්වේ F -42 කාණ්ඩය යටතේ මීටර් 14.27 ක දුරක් වාර්තා කරමින් ලෝකඩ පදක්කමට හිමිකම් කීය.





# වාර්ෂික ක්‍රීඩා උළෙලේ
## ප්‍රධාන අමුත්තා ලෙස එක්වෙමින්



මාතලේ විජය විද්‍යාලයීය වාර්ෂික ක්‍රීඩා උළෙල බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණයේදී ඉකුත් මැයි මස 03 වන දින අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස විජය විද්‍යාලයේ විදුහල්පති රාජිත තීක්ෂණ මහතාගේ ආරාධනයෙන් එම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහභාගී විය.

මලල ක්‍රීඩා ඉසව් ගණනාවක් ඇතුළත් වූ මෙම ක්‍රීඩා උළෙලට වර්ණවත් තූර්ය වාදක සංදර්ශනයක්ද ඇතුළත් විය. උත්සවය අතරතුරදී විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමයේ කොළඹ ශාඛාවේ උප සභාපති බ්‍රිගේඩියර් එස්එම්ඩබ්ලිව්බීඑන් තලගහවත්ත (විශ්‍රාමික) විසින් අලුතින් නිර්මාණය කරන ලද විද්‍යාලයීය මෝටර් රථ ලාංඡනය ද යුද්ධ හමුදාධිපති වෙත ප්‍රදානය කරන ලදී.

ක්‍රීඩා උළෙලේදී පාසල් සිසුන්ගේ අලංකාරවත් සරඹ පෙළපාළියක් මඟින් ආරාධිත අමුත්තා වෙත ගෞරවාචාර පුදකළේය. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් රැස්ව සිටි පිරිස අමතා, තම පාසල් දිවියේ අතීත මතකයන් සිහිපත් කරමින්, අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකරගෙන යන අතරතුරම ක්‍රීඩාවන් සහ විෂය බාහිර ක්‍රියාකාරකම්ද උසස් අයුරින් පවත්වාගෙන යාමට සිසුන් දිරිමත් කරන ලදී. තවද, ක්‍රීඩා උළෙල අවසානයේ සංගීත භාණ්ඩ තොගයක් විද්‍යාලයීය බටහිර තූර්ය වාදක කණ්ඩායම වෙත භාරදීමද යුද්ධ හමුදාධිපතිගේ අතින් සිදුවිය.






# බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නයක් විවෘත කෙරේ



ඉංජිනේරු සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නවතමයෙන් ඉදිකරන ලද බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නය ඉකුත් මැයි මස 13 වන දින විවෘත කෙරිණ. එම අවස්ථාවට මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂක ජෙනරාල් සහ ඉංජිනේරු සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සීගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

ඉංජිනේරු සේවා බලකා රෙජිමේන්තුවේ හටපිරිස්හි තාක්ෂණික දැනුමෙන් සහ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද මෙම නව දෙමහල් ගොඩනැගිල්ලේ භෝජනාගාර ශාලාවක්, සලාක ගබඩාවක්, සලාක කාර්යාලයක්, මුළුතැන්ගෙයක්, ඇඳුම් මාරු කිරීමේ කාමරයක්, බීමහලක් සහ ලොබි පහසුකම් සහිතය. මෙම නව බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නය ඉදිවීම එම රෙජිමේන්තුවේ එතෙක් පැවති විශාල අඩුපාඩුවක් සපුරාලීමකි.









# පරම වීර විභූෂණයෙන් පිදුම් ලැබූවන් අනුස්මරණයට ඡායාරූප එකතුවක්

"පරම වීර විභූෂණ" පදක්කමෙන් පිදුම් ලැබූ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත යුද විශිෂ්ටයින්ගේ ඡායාරූප එකතුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි මස 22 වන දින විවෘත කරනු ලැබීය.

වීරත්වය වෙනුවෙන් පිරිනමන ශ්‍රී ලංකාවේ ඉහළම හමුදා ගෞරවය මෙම පරම වීර විභූෂණය වන අතර, යුද්ධයේදී තම ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කොට එම පදක්කම හිමිකරගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිලයින් අනුස්මරණය කිරීම වස් මෙම ඡායාරූප එකතුව නිරාවරණය කෙරිණ.



# පාකිස්ථාන ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නියෝජිත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති



පාකිස්ථාන ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පාඨමාලා හදාරනු ලබන ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත දූත පිරිසක් ඔවුන්ගේ එම විෂය නිර්දේශයේ කොටසක් ලෙස දින හයක අධ්‍යාපන චාරිකාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින අතර, ඔවුනු ඉකුත් මැයි මස 06 දින යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත වූහ.

එයාර් කොමදෝරු ෆයිසාල් ෆසාල් මුහම්මද් ඛාන් (*Air Commodore Faisal Fazal Muhammad Khan*)ගේ ප්‍රධානත්වයෙන් යුත් 15 දෙනකුගෙන් සමන්විත එම දූත පිරිස වැඩබලන යුද්ධ හමුදා පුහුණු අධ්‍යක්ෂ කර්නල් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී විසින් යුද්ධ හමුදා මූලස්ථානයේදී උණුසුම් ලෙස පිළිගනු ලැබීය.

අනතුරුව, නියෝජිත කණ්ඩායම් ප්‍රධානී එයාර් කොමදෝරු ෆයිසාල් ෆසාල් මුහම්මද් ඛාන්, විශ්ව විද්‍යාලයීය සාමාජික බ්‍රිගේඩියර් වකාස් අලි ඛාන් (*Brigadier Waqas Ali Khan*), පාඨමාලා සාමාජිකයකු වන කොමදෝරු මුහම්මද් කාෂිෆ් ෆර්හාන් (*Commodore Muhammad Kashif Farhan*) සහ පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාවේ හා මාලදිවයින් ආරක්ෂක උපදේශක කර්නල් මුහම්මද් ෆාරුක් පීඑස්සී (*Colonel Muhammad Farooq psc*) යුද්ධ හමුදාධිපති හමුවී සුහද සාකච්ඡාවක නිරත වූහ. මෙම හමුවේදී වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකා සහ පාකිස්ථාන සන්නද්ධ හමුදාවන් අතර පවතින සහයෝගීතාවය, අවබෝධය සහ පුහුණු පාඨමාලාවන් සඳහා හවුපිරිස් සහභාගී කරගැනීම තවදුරටත් වර්ධනය කෙරිණ.

# ශ්‍රී ලංකාවේ පාකිස්ථාන මහ කොමසාරිස් යුද්ධ හමුදාධිපති හමුවෙයි

ශ්‍රී ලංකාවේ පාකිස්ථානු ඉස්ලාමීය ජනරජයේ නව මහ කොමසාරිස්තුමන් වශයෙන් පසුගියදා ධූරයේ රාජකාරි භාරගනු ලැබූ මේජර් ජෙනරාල් (ආර්) ෆහීම් උල් අසීස්, එච්අයි (එම්) (Major General (R) Faheem Ul Aziz, HI (M) පසුගිය මැයි මස 16 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. මෙම සුහද හමුවේදී දෙරට අතර දිගුකාලයක් පුරා පවතින මිත්‍රත්වය පිළිබඳව මෙන්ම දෙරටේ සහයෝගීතාවය වැඩිකර ගැනීම පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය.



# මියන්මාරයේ තානාපතිතුමිය යුද්ධ හමුදාධිපති හමුවෙයි



මියන්මාරයේ නව ශ්‍රී ලංකා තානාපතිනී ප්‍රභාෂිනී පොන්නම්පෙරුම මහත්මිය සිය ධූරයේ රාජකාරි භාර ගැනීම සඳහා මියන්මාරය වෙත පිටත්ව යාමට පෙර පසුගිය මැයි මස 22 වන දින යුද්ධ හමුදාධිපතිතුමා හමුවූවාය. 2003 වසරේ තානාපති සේවයට එක් වූ එතුමිය 2021 වසරේ සිට 2023 වසර දක්වා විදේශ වත්කම් කළමනාකරණ අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජෙනරාල් තනතුර හෙබවූ අතර, දැනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ අප්‍රිකානු රජයේ සම්බන්ධීකරණ කටයුතු අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස කටයුතු කරන්නීය.

මෙම සුහද හමුවේදී යුද්ධ හමුදාධිපතිතුමන් නව තානාපතිතුමියගේ පත්වීම වෙනුවෙන් සිය සුභාශිංසන එක් කළ අතර, ශ්‍රී ලංකාව සහ මියන්මාරය අතර ද්විපාර්ශ්වීය සුහදතාවය වැඩි දියුණු කරගැනීමේ වැදගත්කම පිළිබඳව ද එහිදී එතුමන් අවධාරණය කළේය.

# අභාවප්‍රාප්ත මේජර් සීබී කොහොන (විශ්‍රාමික) වෙත යුද්ධ හමුදාධිපති අවසන් ගෞරව දක්වයි





අභාවප්‍රාප්ත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ මේජර් සීබී කොහොන (විශ්‍රාමික) ගේ දේහයට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය මැයි මස 16 වන දින මහනුවර පිහිටි ඔහුගේ නිවසේදී සිය අවසන් ගෞරවය දැක්විය.

මාතලේ විජය විද්‍යාලයේ යුද්ධ හමුදාධිපතිතුමන් ඉගෙනුම ලබන අවධියේ හිටපු පාසල් ශිෂ්‍යභට ගුරුවරයකු ද වූ එම නිලධාරී වෙත යුද්ධ හමුදාධිපති එහිදී අවසන් ගෞරව දක්වා එම පවුලේ සාමාජිකයන් වෙත සිය ශෝකය ප්‍රකාශ කළේය.



මේජර් සීබී කොහොන (විශ්‍රාමික) 2024 මැයි මස 14 ඉරිදා දින ඇති වූ අසනීප තත්වයක් හේතුවෙන් නාරාහේන්පිට, කොළඹ යුද්ධ හමුදා රෝහලේදී අභාවප්‍රාප්ත වූ අතර, ඒ වනවිට එතුමන් 73 වන වියේ පසුවිය.

එතුමන් 1983 මාර්තු මස 07 වන දින CCC-1 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට බඳවා ගන්නා ලද අතර, අනතුරුව දියතලාව ශ්‍රී ලංකා හමුදා විද්‍යාපීඨයෙන් මූලික හමුදා පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් පසු, ඔහු දෙවන ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය වෙත එක්විය. යුද්ධ හමුදා සේවා කාලය තුළ විවිධ තනතුරු හොබවමින් වර්ෂ 2011 ජනවාරි මස 18 වන දින හෙතෙම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් විශ්‍රාම දිවියට එළඹිය.

# උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල්වරු යුද්ධ හමුදාධිපති හමුවෙති



2024 මැයි මස 19 වන දිනට යෙදී තිබූ 15 වන ජාතික රණවිරු සැමරුම් දිනයට සමගාමීව මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ මේජර් ජෙනරාල් ඩීබීඑල් කොළොන්න යූඑස්පී සහ මේජර් ජෙනරාල් ටීසී පීරිස් ආර්එස්පී යූඑස්පී යන නිලධාරීන් යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ. එහිදී, එම නිලධාරීන් සමග සුහද පිළිසඳරක නිරත යුද්ධ හමුදාධිපති නව මේජර් ජෙනරාල්වරුන් වෙත අසිපත් පිරිනමමින් සංකේතාත්මකව එම නිලයේ අධිකාරිය පිරිනමනු ලැබීය.



පසුගිය දා උසස්වීම් ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීපී සිසිර කුමාර ආර්එස්පී වෙත පසුගිය මැයි මස 31 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපතිගේ සුරතින් නිල ලාංඡන පැළඳවීය. මෙම අවස්ථාවේදී පැවති සුහද හමුවේදී, ජාතියේ අභිවෘද්ධිය උදෙසා දශක තුනකට අධික කාලසීමාවක් පුරාවට එතුමන් විසින් සිදුකරනු ලැබූ අනුපමේය සේවය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති සිය කෘතඥතාවය පුදකළේය.



## සත්කාරක සේවාවන් රැසක්



ශ්‍රී ලංකාව තුළ ඉතා වැදගත් ආර්ථික, ජෛව විවිධත්ව හා පාරිසරික වටිනාකමකින් යුත් මී සහ කොස් පැළ දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාපිත යුද්ධ හමුදා කඳවුරු තුළ රෝපණය කිරීම සඳහා 306-සී 1 ජාත්‍යන්තර සිංහ දිස්ත්‍රික්කයේ සිංහාධිපති ඇතුළු සාමාජික සාමාජිකාවන් විසින් සංකේතාත්මකව පිරිනැමීමේ වැඩසටහනක් පසුගිය මැයි මස 15 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

මෙම වැඩසටහන සඳහා ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී වූ අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, 306-සී 1 ජාත්‍යන්තර සිංහ දිස්ත්‍රික්කයේ සිංහාධිපති පන්ථක දාබරේ ඇතුළු සාමාජික සාමාජිකාවන් පිරිසක් ද ඊට එක්වූහ. තවද, 306-සී 1 ජාත්‍යන්තර සිංහ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සභාපති සිංහ - මේජර් තුෂාර සමරතුංග (විශ්‍රාමික) විසින් තම පුද්ගලික ධන පරිත්‍යාගයෙන් යුද්ධයේදී රණකාමිතයට පත් රණවිරුවන්ගේ පරිහරණය සඳහා රෝද පුටු දෙකක් ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත එහිදී පරිත්‍යාග කරන ලදී.

# මහනුවර යුද්ධ හමුදා මූලික රෝහලේ නිරීක්ෂණ චාරිකාවක

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියූ නුදුරේදී විවෘත කිරීමට නියමිත මහනුවර යුද්ධ හමුදා මූලික රෝහලේ වත්මන් කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා ඉකුත් මැයි මස 07 වන දින නිරීක්ෂණ චාරිකාවක නිරත විය. රෝහල් පරිශ්‍රය වෙත සපැමිණි එතුමන් යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් පීජීසී ප්‍රනාන්දු යූඑස්පී සහ මහනුවර යුද්ධ හමුදා මූලික රෝහලේ අණදෙන නිලධාරී විසින් උණුසුම් අයුරින් පිළිගත්හ.



අනතුරුව එම රෝහලේ කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්එම්පීඩබ්ලිව්ඩබ්ලිව්බීආර් පාලමකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් මාණ්ඩලික ප්‍රධානී වෙත රෝහලේ වත්මන් පරිපාලන කටයුතු පිළිබඳව සවිස්තරාත්මක දැනුවත් කිරීමක් සිදුකරන ලදී. එම සංචාරයේදී එතුමන් රෝහලේ වාට්ටු, ශල්‍ය ඒකක, දන්ත වෛද්‍ය පහසුකම්, මුළුතැන්ගෙය, සෙසු නිල නවාතැන් පහසුකම් හා කඳවුරු පරිශ්‍රය නිරීක්ෂණය කරනු ලැබීය. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඇතුළු පිරිසක්ද එක්වූහ.







# අණදෙන නිලධාරීන් අමතයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියූ පසුගිය මැයි මස 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ගජබා රෙජිමේන්තු ඒකකයන්හි අණදෙන නිලධාරීන් ආමන්ත්‍රණය කළේය. එම රෙජිමේන්තුවේ 13 වන රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරි භාරගැනීමෙන් අනතුරුව එතුමන් තම ඒකක අණදෙන නිලධාරීන් පළමු වරට ආමන්ත්‍රණය කළ අවස්ථාව එය විය.



# සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සමරමින්









ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ අලුත් අවුරුදු උත්සවය ඉකුත් අප්‍රේල් මස 08 වන දින සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ සහ එම මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථාන පරිශ්‍රයේ පැවති මෙම සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සඳහා නියෝජ්‍ය සේනාවිධායක එම්ටීකේආර් සිල්වා කේඑස්පී සහ එම මහත්මිය ඇතුළු එම මූලස්ථාන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්, සෙසුනිල විශාල පිරිසක් සහභාගී වූහ.

# ස්වේච්ඡා බලසේනා අත්පන්දු ශූරතාවය






"ස්වේච්ඡා බලසේනා අන්තර් රෙජිමේන්තු අත්පන්දු තරඟාවලිය" 2024 මාර්තු මස 18 සිට 22 වන දින දක්වා ස්වේච්ඡා බලසේනා රෙන්ඩෝවර්ස් ක්‍රීඩාපිටියේදී පැවැත්විණ. එහි අවසන් දින උත්සවය පනාගොඩ යුද හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් මාර්තු මස 22 වන දින උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලද්දේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායකගේ ප්‍රධානත්වයෙනි.

මෙම තරඟාවලියට සුපර් ලීග් කාණ්ඩයේ කණ්ඩායම් 04 ක් ද "ඒ" කාණ්ඩයේ කණ්ඩායම් 16 ක් ද වශයෙන් පිරිමි කණ්ඩායම් 20 ක් තරඟ වැදුණු අතර, කාන්තා කණ්ඩායම් 04 ක්ද එක්වූහ. වොලිබෝල් පිරිමි අවසන් මහා තරඟය සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායම සමඟින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම සුදුසුකම් ලබාගත් අතර, එහිදී 2018 හා 2019 වර්ෂවලදී ශූරයන් වූ සිංහ රෙජිමේන්තු කණ්ඩායම මෙවරද ශූරතාවය දිනාගැනීමට සමත්විය.

කාන්තා වොලිබෝල් තරඟාවලියේ අවසන් තරඟය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා කණ්ඩායම සමඟින් 2 (සේවී) කාන්තා බලකා කණ්ඩායම තරඟ වැදුණු අතර, එහිදී 2 (සේවී) කාන්තා බලකා කණ්ඩායම ශූරතාවය දිනාගත්තේය. මෙම තරඟාවලියේ ජයග්‍රාහකයින් සඳහා ප්‍රධාන අමුත්තාගේ සුරතින් කුසලාන, පදක්කම් හා සහතිකපත් ප්‍රදානය කරන ලද අතර, එම අවස්ථාවට ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, නිලධාරිනියන්, සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.



# කැමරා තාක්ෂණය හා වීඩියෝකරණ වැඩමුළුවක්



යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත කැමරා හා වීඩියෝකරණය පිළිබඳ වැඩමුළුවක් පසුගිය අප්‍රේල් මස 22 හා 23 යන දෙදින පැවැත්විණ. Metropolitan Technologies (PVT) Ltd ආයතනයේ උපදේශකයින්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම වැඩමුළුව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සහ ඒ යටතේ ඇති පාබල සේනාංක, පාබල බලසේනා හා බළඇණි නියෝජනය වන අයුරින් නිලධාරී 10 දෙනකු සහ සෙසුනිලයින් 65 දෙනකු එක්වූහ. මෙම වැඩමුළුව තුළින් කැමරා තාක්‍ෂණය හඳුන්වාදීම, වීඩියෝ කැමරා හඳුන්වාදීම, නිශ්චල වීඩියෝ න්‍යාය සහ ප්‍රායෝගික දැනුම සබැඳිව දැනුවත් කෙරිණි.








# සංචාරයක මතක සටහන්





අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික (වැඩබලන) හා උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ජීකේ රාජපක්‍ෂ ආර්එස්පී ඉකුත් අප්‍රේල් මස 29 වන දින යාපනය ආරක්‍ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක නිරතවූහ.

එහිදී, එම ආරක්ෂක සේනා මූලස්ථාන සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති සම්මන්ත්‍රණයක් සඳහා ද සහභාගී වූ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික (වැඩබලන) හා උපකරණ මාස්ටර් ජෙනරාල් සහ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත යුද්ධ හමුදා කඳවුරු ආශ්‍රිත වත්මන් තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරනු ලැබූහ. මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, 52 වන පාබල සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති, බලසේනාධිපතිවරු ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.



# බලඇණි පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්





5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ බලඇණි පුහුණු පාඨමාලාව ඉකුත් මාර්තු මස 18 වන දින සිට මැයි මස 10 වන දින දක්වා ගල්කුලම පාබල බලඇණි පුහුණු පාසලේදී පැවැත්විණ. එහි සමාප්ති උත්සවය සඳහා සහභාගී වූ ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් සමාප්ති දේශනය සිදුකරමින් එම පුහුණුවේ ඇති වැදගත්කම පිළිබඳව අවධාරණය කළහ.

බලඇණි පුහුණුව සඳහා නිලධාරීන් 9 දෙනෙක් සහ සෙසු නිලයින් 443 දෙනෙක් සහභාගී වූ අතර, පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යාට හිමි සම්මානය කපිතාන් ඩීජේකේඑස් දෙණියගෙදර ද දක්ෂතම වෙඩික්කරුට හිමි සම්මානය ලා/කෝ තිස්ස කුමාර කේජීබී යන කොනොනි ද හොඳම ශාරීරික යෝග්‍යතාවය හිමි සෙබළාට හිමි සම්මානය සාමාන්‍ය සෙබළ කුමාරසේකර කේඩීඑස් ද හිමිකරගත්හ. සමාප්ති උත්සවය සඳහා 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති ගේ උපදෙස් මත 12 විජයබාහු පාබල රෙජිමේන්තුවේ බලඇණි පුහුණු පාඨමාලා අංක 36 ද ඉකුත් මාර්තු මස 18 දින සිට මැයි මස 10 දින දක්වා ආලන්කුලම් පුහුණු පාසලේ දී පැවැත්විණ. මෙම පාඨමාලාව සඳහා නිලධාරීන් 08 දෙනෙක් සහ සෙසු නිලයෝ 407 දෙනෙක් සහභාගී වූහ. තවද, මෙහිදී 12 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ කණ්ඩායමක් විසින් බලඇණි පුහුණුවේ සමාප්තියට පෙර දිනයේදී "ජයසිකුරු මෙහෙයුම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් ද සිදුකරනු ලැබීය. පාඨමාලාවේ සමාප්ති දේශනය ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති විසින් සිදුකරනු ලැබූ අතර, එහිදී දක්ෂතම සිසුවාට සහ දක්ෂතම වෙඩික්කරුට හිමි සම්මානය ලාන්ස් කෝප්‍රල් හේරත් එච්සීකේ විසින්ද හොඳම ශාරීරික යෝග්‍යතාවය හිමි සෙබළාට හිමි සම්මානය පාබල සෙබළ දිසානායක ඊඑම්සී විසින්ද හිමිකරගත්හ. මෙම අවස්ථාවට 57, 56 වන පාබල සේනාංකවල සේනාංකාධිපතිවරු ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.







22 වන පාබල සේනාංක සංචාරය අතරතුරදී

# සංචාරයක මතක සටහන්



24 වන පාබල සේනාංකයේ භටපිරිස් සමඟ සුහද කතාබහක නිරතවෙමින්


ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති ලෙස රාජකාරි භාරගත් මේජර් ජෙනරාල් එස්ඩී තුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී පසුගිය අප්‍රේල් සහ මැයි මාසවලදී 22 හා 24 වන පාබල සේනාංක මූලස්ථානයන්හි සහ ඒ යටතේ ඇති බලසේනා සහ ඒකකයන්හි නිල සංචාරයක නිරතවිය.

තවද, මෙම සංචාරයේදී ආඥාපති විසින් 24 වන පාබල සේනාංකයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන දීඝවාපිය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සහ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. එහිදී, එතුමන් එම ව්‍යාපෘතිවල සේවය කරන භට පිරිස් සමගින් සුහදව අදහස් හුවමාරු කරගනිමින් ඒ වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම අගය කළේය. ඉන් අනතුරුව 232, 242 සහ 243 වන පාබල බලසේනාවන්හි සහ 14 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත ද සංචාරයේ නිරත ආඥාපති එහි භටපිරිස්වල කාර්යභාරය සහ වගකීම් පිළිබඳව සොයාබැලීය.



232 වන පාබල බලසේනාවේ සංචාරය අතරතුර

දීඝවාපිය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සහ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කරමින්










# පාඨමාලාව හැදෑරූ භටයෝ විසිරයති

පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී ශාරීරික අභ්‍යාස පුහුණු උපදේශක පාඨමාලාවන්හි සහ මූලික පිහිනුම් පාඨමාලාවේ විසිරයාමේ උත්සවයක් ඉකුත් මැයි මස 07 වන දින පැවති අතර එහිදී, 4 වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සපුරණ ලද 2024 පළමු කණ්ඩායම සඳහා සහතික ප්‍රදානය කිරීමක්ද සිදුකෙරිණ. විසිරයාමේ උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති සහ සන්නාහ සන්නද්ධ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී වූයේය.











## බෝධිරාජාරාම විහාරස්ථාන පරිශ්‍රයේදී භාවනා වැඩසටහනක්

ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති සහ යුද්ධ හමුදා බෞද්ධ සංගමයේ ප්‍රධානී මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ අදහසකට අනුව ඉකුත් අප්‍රේල් මස 27 වන දින බෝධිරාජාරාම විහාරස්ථාන පරිශ්‍රයේදී භාවනා වැඩසටහනක් පැවැත්විය. යුද්ධ හමුදා යුද විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සම්බන්ධීකරණ සහයෝගය මත පැවැත්වූ මෙම වැඩසටහන මගින් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයන් සහ සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ ආධ්‍යාත්මික සුවතාවය වැඩිදියුණු කිරීම අරමුණ විය. පූජ්‍ය රාජගිරියේ අරියඥාන හිමිපාණන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා කිහිපනමකගේ වැඩමවීමෙන් පැවති මෙම භාවනා වැඩසටහන සඳහා 14 සහ 61 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, නිලධාරීන්, සෙසුනිලයන් සහ සිවිල් වැසියෝ 2000 කට අධික පිරිසක් සහභාගී වූහ.



## දියතලාව 'Garrison Manor' නිවාඩු නිකේතනය විවෘත කරයි





දියතලාව ස්ටේෂන් කන්ද කඳවුරු පරිශ්‍රයෙහි ආරම්භ කරනු ලැබූ '*Garrison Manor*' නිවාඩු නිකේතනය ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි මස 15 වන දින විවෘත කරනු ලැබීය. දියතලාව ප්‍රදේශයට පැමිණෙන නිලධාරීන්, සෙසුනිලයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ අරමුණින් මෙම නිවාඩු නිකේතනය ආරම්භ කෙරිණ. 17 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස්හි ශ්‍රමදායකත්වය සහ තාක්ෂණික දැනුම යොදා ගනිමින් නිවාඩු නිකේතනයේ ඉදිකිරීම් කටයුතු නිමකරන ලදී.

# වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උලෙළට එක්වෙමින්







ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උලෙළ ඉකුත් අප්‍රේල් මස 26 වන දින හැව්ලොක් පිටියේදී පැවති අතර, එහි විදුහල්පතිනි චන්ද්‍රි සිරිවර්ධන මහත්මිය ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් සහ ඉංජිනේරු සේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී වූයේය. මෙම උත්සවයේදී, මලල ක්‍රීඩා තුළින් සුවිශේෂී දක්ෂතා දැක්වූ එම විද්‍යාලයීය ක්‍රීඩිකාවන් ප්‍රධාන අමුත්තා අතින් ඇගයීමට ද ලක්විය.

# සංචාරයක මතක සටහන්

අධ්‍යක්ෂක ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ ඉංජිනේරු සේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් මැයි මස 02 වන දින ඉංජිනේරු සේවා වෘත්තීය පුහුණු පාසල, 2 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, සහ 9 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ නිල සංචාරයක නිරත වූයේය.

එහිදී, ඉංජිනේරු සේවා වෘත්තීය පුහුණු පාසලේ සේනාවිධායක විසින් එම පුහුණු පාසලේ පාඨමාලා විෂය මාලාව සහ අරමුණු පිළිබඳවත් ඒකක අණදෙන නිලධාරීන් විසින් එම ඒකකයන්හි කාර්යභාරය සහ වගකීම් පිළිබඳවත් බලකාධිපතිව දැනුවත් කළහ. එහිදී, බලකාධිපති හටපිරිස් අමතමින් ඔවුන්ගේ කැපවීම සහ වෘත්තීයභාවය ඇගයීමට ලක්කළේය. අනතුරුව, සියලු නිල තේ පැන් සංග්‍රහයකට සහභාගී වූ හෙතෙම එහි හටපිරිස් සමඟින් සුහද පිළිසඳරක ද නිරත වූහ. මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් කේඑල් මුණසිංහ යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයන් පිරිසක් ද එක්වූහ.







# පාඨමාලා ආරම්භය සනිටුහන් කරමින්





යුද්ධ හමුදා යුද විද්‍යාලය වෙතින් පැවැත්වෙන ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - අංක 11, කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - අංක 30 සහ කණිෂ්ඨ මාණ්ඩලික පාඨමාලා - අංක 26 යන පාඨමාලාවන්හි සමාරම්භක උත්සවය ඉකුත් මැයි මස 02 වන දින එම විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. මෙම පාඨමාලා හැදෑරීම සඳහා ඕස්ට්‍රේලියාව සහ සැම්බියාව නියෝජනය කරමින් නිලධාරීන් දෙදෙනක්ද ඇතුළුව ශිෂ්‍ය නිලධාරීන් 117 දෙනෙක් සහභාගී වූහ.

# ඉගෙනුමට අත්වැලක්







12 වන පාබල සේනාංක බලප්‍රදේශයේ පිහිටි ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අභයපුර සුරනිමල ප්‍රාථමික පාසලෙහි ඉගෙනුම ලබන ආර්ථික දුෂ්කරතාවන් සහිත සිසුන් 60 දෙනකු හට පාසල් පාවහන් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 03 වන දින සිදුකෙරිණ. මෙම සත්කාර්ය සඳහා හොංකොං හි පදිංචි ඔස්මන් ද අල්විස් පූජකතුමා ඇතුළු පිරිසක් මූල්‍ය දායකත්වය සපයා තිබිණි. මෙම අවස්ථාව සඳහා 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන්, පරිත්‍යාගශීලීන්, දෙමාපියන්, විදුහල්පති, ආචාර්ය මණ්ඩලය ඇතුළු සිසු සිසුවියෝ විශාල පිරිසක් සහභාගී වූහ.

# විරු දෑතින් සත්කාරයක්



මොණරාගල දිස්ත්‍රික්කයට අයත් කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරවිල ග්‍රාමයේ ආර්ථික දුෂ්කරතාවන් සහිත පවුලක් වෙත පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ළිඳක් සහ සෙසු සනීපාරක්ෂක පහසුකම් සපයාදීමට 20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අණදෙන නිලධාරීගේ පූර්ණ අධීක්ෂණය මත එහි භටපිරිස් ඉකුත් මැයි මස 04 වන දින කටයුතු කළහ. 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මිතුරකු වන සුමිත් තෙන්නකෝන් සහ ඔහුගේ සොහොයුරිය වන සමරා තෙන්නකෝන් යන දෙපළ ඊට අවශ්‍ය මූල්‍ය දායකත්වය සැපයූහ. මෙම සත්කාරය සිදුකළ අවස්ථාවට 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, නිලධාරීන් හා සෙසුනිලයින් රැසක්ද එක්වූහ.

# සිරිපා කරුණාවට රණවිරු දායකත්වය





මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිසුන් 60 ක කණ්ඩායමක් සහ ඔවුන් සමඟ එක්වූ දශ්‍යාබාධිත 40 ක කණ්ඩායමක් ඉකුත් මැයි මස 01 හා 02 දෙදින තුළ ඓතිහාසික ශ්‍රී පාදස්ථානය වැඳපුදා ගැනීම සඳහා එක්වූහ. ඔවුන් විසින් ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපතිගෙන් සිදුකළ ඉල්ලීමකට අනුව 11 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ස්ථාපිත 19 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ අණදෙන නිලධාරීගේ සම්බන්ධීකරණයෙන් ලංකා විදුලිබල මණ්ඩලය යටතේ පාලනය වන "සමනල වන අරණ" නිවාඩු නිකේතනයෙහි ඔවුන් හට නවාතැන් පහසුකම් හා ආහාර පිළියෙල කරදීමට කටයුතු කෙරිණ.

# නවවන සංවත්සරය අභිමානවත්ව සමරමින්





10 රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ නවවන සංවත්සරය ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් මස 29 වන දින පැවැත්විණ. එහිදී, අණදෙන නිලධාරී වෙත පිරිනැමූ සම්මාන මුරය, මීගොඩ සංහිඳ ළමා නිවාසයේ ළමුන් සඳහා පැවැත්වූ දිවා භෝජන සංග්‍රහය, බෝධිපූජා පිංකම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය සහ සියලු නිල සුහද හමුව සංවත්සර වැඩසටහන් අතර කැපීපෙනුණි. මෙම අවස්ථාවන් සඳහා එම ඒකක සියලු නිලයෝ සමුහිකව එක්රොක් වූහ.

# සිංහල හා දමිළ අලුත් අවුරුද්ද සමරමින්







10 ශ්‍රී ලංකා ජාතික අරක්‍ෂක බළමුළුවේ නිලධාරීන් හා සෙසුනිලයින් මානසික ඒකාකාරීත්වයෙන් මුදවාලීමේ අරමුණින් එහි අණදෙන නිලධාරී මේජර් අයිජීආර් ධම්මික ගේ මගපෙන්වීම මත හෙළ කෙලි සෙල්ලම් සමගින් සිංහල හා දමිළ අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කෙරිණ. පසුගිය අප්‍රේල් මස 15 වන දින ඒකක පරිශ්‍රයේදී පැවැත්වූ මෙම අලුත් අවුරුදු උත්සවයට 144 වන පාබල බලසේනා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ලුතිනන් කර්නල් එස්එම්එස් බණ්ඩාර ආර්එස්පී ප්‍රධානත්වය දැරිය.

# ඒකක සංචාරයක නිරත වෙමින්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ කර්නල් සේනාවිධායක හා යාපනය හකාස අණසක ආඥාපති මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඑච්ඊ ඉකුත් අප්‍රේල් මස 25 වන දින, 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ කඳවුරු සංචාරයක නිරත විය. එහිදී, එම ඒකකයේ පාලන කටයුතු පිළිබඳව සොයා බැලූ හෙතෙම ඒකක සාමාජිකයින් සමග සුහද කතාබහකද නිරතවූහ.

# සේනාංකයට නව රජකහලක්





14 වන පාබල සේනාංක මූලස්ථානය යටතේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සුබසාධනය සඳහා රෙදි සෝදන ස්ථානයක් (රජකහලක්) ස්ථාපනය කර පසුගිය මැයි මස 07 වන දින විවෘත කෙරිණ. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ උපදෙස් මත ඉදිවූ මෙම රජකහල එතෙක් එම සේනාංකයට තිබූ විශාල අඩුපාඩුවක් සපුරාලීමකි.

# බලඇණි පුහුණු පාසල ප්‍රතිසංස්කරණය කෙරේ





22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ මගපෙන්වීම හා 223 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් වයිඑච්පී රංගජීව යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද තාවුල්වැව බලඇණි පුහුණු පාසල ඉකුත් මැයි මස 03 වන දින යළි විවෘත කෙරිණ. එතෙක් කලක් අතහැර දමාතිබූ මෙම පුහුණු පාසල එලෙස යළි විවෘත කිරීමත් සමගම ඉදිකටුවැව සහ මයිලවැව ස්ථාපිතව තිබූ 6 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ "ඒ" සහ "බී" බලගණ දෙකද එහි අනුයුක්ත කරනු ලැබිය.

# තැන තැන වෙසක් අසිරිය

## ලේ දන්දීමේ වැඩසටහනක්





වෙසක් පොහොය දිනයට සමගාමීව 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම යටතේ 553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්ඒඅයිඑස් මෙන්ඩිස් ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය මත තර්මපුරම් දිස්ත්‍රික් රෝහලේ ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 18 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් 50 ක පමණ සංඛ්‍යාවක් සහභාගී වූහ.

## වෙසක් පොහොයට දන්සැලක්





වෙසක් පොහොය නිමිති කරගනිමින් 23 ගැමුණු හේවා බලකාය විසින් පසුගිය මැයි මස 24 වන දින ඒ-9 මාර්ගය අසල සිසිල් පැන් හා බනිස් දන්සැලක් පවත්වන ලදී. ඒ සඳහා ඒකක අණදෙන නිලධාරි ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් දායක වූහ.

## සමාජ සත්කාරයක්



වෙසක් පොහොය දිනයට සමගාමීව 6 කාලතුවක්කු හමුදාව විසින් කුරවලාන, කහටෝවිට "සෙවණ" වැඩිහිටි නිවාසය වෙත දිවා ආහාර වේලක් ලබාදීම සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 18 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට එම ඒකකයේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ජීආර්ආර්කේඑස් ජයරත්න ආර්එස්පී පීඑස්සී අයිජී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් එක්වූහ.

# තැන තැන වෙසක් අසිරිය

## වෙසක් කලාපයක් සහ බත් දන්සැලක්





593 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එච්වීජ් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත එහි හටපිරිස් ඒකරාශී වී පුතුකුඩ්ඉරිප්පු පොදු ක්‍රීඩාංගණයේ අලංකාර වෙසක් කලාපයක් සහ බත් දන්සැලක් ඉකුත් මැයි මස 23 සහ 24 යන දෙදින පවත්වන ලදී. ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහ 59 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද එක්වූ මෙම දන්සැලට පුදුකුඩිඉරිප්පු ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගී වූහ.

## 22 වන පාබල සේනාංකයෙන් බත් දන්සැලක්



ආගමික සහජීවනය සංකේතවත් කරමින් 22 වන පාබල සේනාංකය මගින් සංවිධානය කෙරුණු බත් දන්සැලක් ඉකුත් මැයි මස 23 වන දින පැවැත්විණ. එහිදී, එම සේනාංකයේ රාජකාරී නියුතු හටපිරිස් විසින් බැතිමතුන් 10000 ක් සඳහාද, සේරුවාවිල රජමහා විහාරස්ථානයේ බැතිමතුන් 5500 ක් සඳහාද, තඹලගමුව බැතිමතුන් 6000 ක් සඳහාද ආහාර සපයනු ලැබීය. 15 ශ්‍රී ලංකා පාබල හමුදාව සහ 9 විජයබාහු පාබල රෙජිමේන්තුව ඒකක විසින් මෙම පුණ්‍ය කටයුත්තේ පෙරමුණ ගත්හ.

## බෝධිපූජා පිංකමක් හා වෙසක් කූඩු ප්‍රදර්ශනයක්





54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීවයිසී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ මගපෙන්වීමෙන් ඓතිහාසික ශ්‍රී මාතොට රජමහා විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍යපාද අඹගහවැවේ සංඝරක්ඛිත හිමියන්ගේ අනුශාසනයෙන් බෝධිපූජා පිංකමක් හා වෙසක් පහන් කූඩු ප්‍රදර්ශණයක් පසුගියදා පැවැත්විණ. 54 වන පාබල සේනාංක බලප්‍රදේශය තුළ රාජකාරී නියුතු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයින් විසින් සංවිධානය කරන ලද එම පුණ්‍ය කටයුත්ත සඳහා සිවිල් වැසියෝ විශාල පිරිසක් සහභාගී වූහ.

# සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් අධ්‍යාපන චාරිකාවක්






52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඑච්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ උපදෙස් මත සහ 521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්එච්ආර් ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් පේදුරුතුඩුව, යාපනය කට්කෝවලම් මෙතෝදිස්ත මිෂන් දමිළ මහා විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් අධ්‍යාපනික චාරිකාවක් ඉකුත් මැයි මස 18 වන දින සංවිධානය කරන ලදී. එම අවස්ථාවට සහභාගී වූ සිසුන් හට ලංකාවේ උතුරු කෙලවර සහ පලාලි ජාත්‍යන්තර ගුවන් තොටුපළ නැරඹීමටත්, කන්කසන්තුරය මුහුදු වෙරළ අසල විනෝද වීමටත්, කන්කසන්තුරය සිට කොඩිකාමම් දක්වා දුම්රිය චාරිකාවකට සහභාගී වීමටත් අවස්ථාව හිමිවිය. තවද, මෙම චාරිකාව සඳහා සහභාගී වූ සිසු සිසුවියන්, දෙමව්පියන් සහ ගුරුභවතුන් හට ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) තුළදී දිවා ආහාරය පිරිනැමීමද විශේෂත්වයකි.

# සුහදත්ව වර්ධනයට පා පන්දු තරඟාවලියක්





551 වන පාබල බලසේනාවේ සහ 7 වන පාබල හමුදාවේ භටපිරිස් විසින් ඉකුත් මැයි මස 14 සිට 17 වන දින දක්වා කිලිනොච්චිය ක්‍රීඩා සංකීර්ණ පරිශ්‍රයේදී පාපන්දු තරඟාවලියක් සංවිධානය කරන ලදී. 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් මත කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ තරුණ ප්‍රජාව අතර සුහදතාවය වර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද මෙම තරඟාවලියෙහි අවසන් මහා තරඟයේදී "ඉලන්තරීර් ක්‍රීඩා සමාජ පාපන්දු කණ්ඩායම" පරදවා "වද්දකච්චි පාපන්දු කණ්ඩායම" තරඟාවලියේ ශූරයින් බවට පත් විය.

# 27 වසක අභිමන සමරමින්





213 වන පාබල බලසේනාවේ 27 වන සංවත්සරය බලසේනාධිපති කර්නල් එච්ජ්ජීඑන්සී ප්‍රභාත් ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ගජසිංහපුර පිහිටි එම බලසේනා මූලස්ථාන පරිශ්‍රයේදී උත්සවාකාරයෙන් පැවැත්විණි. එහිදී, බලසේනාධිපති වෙනුවෙන් පැවති සම්මාන මුරය, රුක් රෝපණය, සියලු නිලයින් ඇමතීම, සංගීත ප්‍රසංගය සහ ක්‍රිකට් තරඟාවලිය සංවත්සර වැඩසටහන් අතර ප්‍රධාන විය.

# බලසේනා මූලස්ථානය නිරීක්ෂණය කරමින්





68 වන පාබල සේනාංකය විසුරුවා හැරීමෙන් පසු එම ස්ථානයේ 593 වන පාබල බලසේනා මූලස්ථානය නැවත ස්ථාපනය කෙරිණ. එම බලසේනා මූලස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පිඑම් විජේසූරිය ආර්ඩබ්ලිව් ආර්එස්පී ඊන්ඩියු පසුගිය පෙබරවාරි මස 08 වන දින එහි සංචාරයක නිරතවිය. එහිදී, 593 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එච්වීජ් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහ ඒ යටතේ පාලනය වන ඒකකයන්හි අණදෙන නිලධාරිවරු එම බලප්‍රදේශය පිළිබඳව හැඳින්වීමක් ද සිදුකරනු ලැබූහ. එහිදී, සේනාංකාධිපති සිය සංචාරයේදී එම භටපිරිස්වල ක්‍රියාත්විත හා පාලන අවශ්‍යතා පිළිබඳවද සොයා බැලීය.

# වියළි සලාක හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාගයක්





නොච්චියාගම සහ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයන් තුළ ජීවත්වන අඩුආදායම්ලාභී පවුල් 200 ක් සඳහා රුපියල් 5000 ක වටිනාකමින් යුත් වියළි සලාක මළු 200 ක් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය මැයි මස 20 වන දින 4 ජාතික ආරක්ෂක බළමුළුවේදී සිදුකෙරිණ. 212 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්සී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන සඳහා මූල්‍ය දායකත්වය දානපති කුමා වීරසූරිය මහතා සහ ඔහුගේ මිතුරන් සපයනු ලැබූහ. 4 ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණයෙන් එම ඒකක භටපිරිස්වල සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පැවැත්විණ.

# වැඩිහිටියන් වෙනුවෙන් දිවා ආහාර වේලක්





21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ මඟපෙන්වීම මත සාලියපුර ශාන්තිපුර ශාන්ත සෙවණ වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් වෙනුවෙන් දිවා ආහාර වේලක් ලබාදීමේ සත්කාරයක් පසුගිය මැයි මස 18 වන දින සිදුකෙරිණ. එහිදී, ඔවුන්ගේ රසාස්වාදය වෙනුවෙන් කැලිප්සෝ සංගීත ප්‍රසංගයක්ද පවත්වනු ලැබීය. මෙම අවස්ථාව සඳහා බලසේනාවට අයත් නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගයක්





වන්නි සහ බටහිර ආරක්‍ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු සෙසුනිලයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 200 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය මැයි මස 10 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක ප්‍රධාන කාර්යාලයේදී එහි සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම සත්කාරය යුද්ධ හමුදා සාමාජිකයින්, සිවිල් සේවක මහත්ම මහත්මීන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල අය සඳහා ආර්ථික සහනයක් ලබාදීමේ අරමුණින් යුතුව සංවිධානය කෙරිණ.

# මාසික මහා සභා රැස්වීමේදී පරිත්‍යාග රැසක්










යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 2024 වර්ෂයේ පස්වන මාසික මහා සභා රැස්වීම ඉකුත් මැයි මස 20 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම මහා සභා රැස්වීම සඳහා සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් හා ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් සහභාගී වූහ. මහා සභා රැස්වීමෙන් අනතුරුව සභාපතිනිය විසින් ශ්‍රී ලංකා සන්නද්ධ බුද්ධි බලකායට අයත් රණවිරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුභසාධනය උදෙසා නිවාසාධාර, අර්ධ නිවාසාධාර, වෛද්‍යාධාර, මූල්‍ය පරිත්‍යාග, වියළි සලාක මළු බෙදාදීම, පාසල් උපකරණ බෙදාදීම ඇතුළු සත්කාර රැසක් සිදුකරන ලදී.



# රණක්ෂිතයට පත් විරුවන්ට වියළි සලාක

ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් තම කායදානය දී රණක්ෂිතයට පත්ව අභිමංසල I,II,III හා අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් හා ඔවුන්ට උපස්ථානය කරනු ලබන අයවළුන් 100 දෙනකු සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය මැයි මස 02 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් කඹුරුපිටිය අභිමංසල II සුවසහන නිකේතනයේදී පැවැත්විණ.





එහිදී, සේවා වනිතා ඒකකයේ පූර්ණ දායකත්වයෙන් ආබාධිත රණවිරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් ඉදිකර ඇති පිහිනුම් තටාකය සඳහා අවශ්‍ය පවිත්‍රතා ද්‍රව්‍ය, ආම්පන්න සහ අනෙකුත් අවශ්‍යතා ඇතුළත් භාණ්ඩ කට්ටලයක් ලබාදෙන ලදී. මෙම අවස්ථාව සඳහා සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන්, යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.



# අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පරිත්‍යාගයක්



යාපනය හා නැගෙනහිර ආරක්ෂක සේනා බලප්‍රදේශ තුළ රාජකාරී නියුතු සෙසුනිලයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 200 දෙනකු වෙත අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය මැයි මස 08 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණ.

යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම මත යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම කටයුත්ත සිදුවිය.





# ඉගෙනුමට අත්වැලක්

ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුරංගි අමරපාල මහත්මියගේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ පාසල් ළමුන් සඳහා පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 09 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි.



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී වූවාය. 2023 ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ ඉංජිනේරු සේවා බලකායට අයත් නිලධාරීන්, සෙබළුන් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ තෝරාගත් ළමුන් 200 දෙනකු සහ 2022 වසරේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයෙන් "ඒ" සාමාර්ථ 9 ක් ලබාගත් ළමුන් සඳහා පාසල් උපකරණ බෙදාදීම මෙම වැඩසටහනේ අරමුණ විය. සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, නිලධාරීන් හා සෙසුනිලයින් රැසක්ද මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

# රුධිරයේ ග්ලූකෝස් මට්ටම නිරීක්ෂණයට උපකරණයක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා මගපෙන්වීම මත යාපනය තිරුනවේලි ප්‍රදේශයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවිපිදූ 1 යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් කෝප්‍රල් සිල්වා ඊඑන් ගේ රෝගාතුරව සිටින මව වෙත රුධිරයේ ග්ලූකෝස් මට්ටම නිරීක්ෂණය කිරීමේ උපකරණයක් පරිත්‍යාග කිරීම ඉකුත් අප්‍රේල් මස 30 වන දින ඇතුල්කෝට්ටේ පිහිටි ඇයගේ නිවසේදී සිදුකෙරිණි. සේවා වනිතා ඒකකයේ මාණ්ඩලික නිලධාරී I (පාලන) ලුතිනන් කර්නල් එස්එම්එන්සී ධර්මසූරිය ගේ සුරතින් අදාළ පරිත්‍යාගය සිදුකළ අතර, එම අවස්ථාව සඳහා සේවා වනිතා ඒකකයේ සහකාර හකාස නිලධාරී සහභාගී විය.

# පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





කාලතුවක්කු හමුදා රෙජිමේන්තුවේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල පාසල් අධ්‍යාපනය හදාරන දූ දරුවන් 200 දෙනකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගිය අප්‍රේල් මස 04 වන දින පැවැත්විණ. තවද, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනියක් වන තනූජා ඩයස් මහත්මිය විසින් යුද්ධ හමුදා සාමාජිකයකුගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවකු සඳහා රෝද පුටුවක් ද පරිත්‍යාග කරන ලදී. මෙම අවස්ථාවට කාලතුවක්කු හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ස්වේන්ද්‍රිනි රොද්‍රිගෝ මහත්මිය ඇතුළු සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

## නිසට සෙවණක්





ඉංජිනේරු බලකායට අයත් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් සුභසාධනය ව්‍යාපෘති රැසක් එම බලකා සේවා වනිතා ශාඛාව මගින් පවත්වාගෙන යනු ලබයි. එහි තවත් එක් පියවරක් ලෙස ඉංජිනේරු බලකායේ සේවයේ නියුතු සිවිල් සේවක එල්ජී සුනිල් ගුණරත්න යන අය වෙනුවෙන් නිවසක් ඉදිකර භාරදීම ඉකුත් මැයි මස 13 වන දින සිදුකෙරිණි. ඉංජිනේරු බලකායේ කර්නල් සේනාධිනායක මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශම්මි ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාව සඳහා මධ්‍යස්ථාන සේනාධිනායක, සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, නිලධාරීන්, සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## වාර්ෂික මහ සභා රැස්වීම






සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහ සභා රැස්වීම ඉකුත් මැයි මස 18 වන දින එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ගංගා හේරත් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සංඥා බලකා ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එහිදී, 4 Ever Skin Natural පුද්ගලික සමාගමේ සභාපතිනි සහ එහි නිර්මාතෘ චාන්දනී බණ්ඩාර මහත්මිය විසින් රූපලාවන්‍ය වැඩසටහනක් පවත්වනු ලැබුවාය. තවද, ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු ලුතිනන් කර්නල් සුජීත් චමින්ද විසින් "යුද හමුදා සාහිත්‍යය" පිළිබඳ වූ හරවත් දේශනයක් ද පවත්වන ලදී. මෙම අවස්ථාවට සංඥා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද එම සේවා වනිතා ශාඛා සමාජිකාවෝ රැසක් එක්වූහ.

## සුමධුර ධර්ම දේශනයක්





වෙසක් පුන් පොහෝ දිනයට සමගාමීව නාරද බෞද්ධ ධර්මායතනාධිපති, ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත පූජ්‍යපාද තලල්ලේ චන්දකිත්ති ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ වැඩමවීමෙන් පාබල හමුදා රෙජිමේන්තුවේ නිලධාරීන් හා සෙසුනිලයින්ගේ ආගමික නැඹුරුව වැඩිදියුණු කිරීම හා මානසික ඒකාග්‍රතාවය දියුණු කිරීමේ අරමුණින් සුමධුර ධර්මදේශනයක් පසුගිය මැයි මස 21 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උපකරණ මාස්ටර් ජෙනරාල් හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ හා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වජිරා පෙරේරා මහත්මියගේ අදහසකට අනුව, පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පැවැත්විණි.

# අභිමංසල 3 සුවතා නිකේතනයේ සංචාරයක





සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් අභිමංසල 3 සුවතා නිකේතනයේ නේවාසික ප්‍රතිකාර ලබමින් සිටින විරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීමේ අරමුණින් ඉකුත් මැයි මස 11 වන දින එහි සංචාරයක නිරතවූහ. සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නෙලූකා නානායක්කාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සංචාරයේදී රුපියල් 150,000.00 ක් වටිනා සන්නිවේදන උපකරණ පරිත්‍යාග කෙරිණි. තවද, ප්‍රතිකාර ලබන රණවිරුවන් සඳහා තේ පැන් සංග්‍රයක් ද ඔවුන්ගේ විනෝදාස්වාදය සඳහා සංගීත වැඩසටහනක් ද පවත්වනු ලැබීය.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් දන්සැලක්





15 වන ජාතික රණවිරු සැමරුම් දිනයට සමගාමීව ඉකුත් මැයි මස 18 වන දින ශ්‍රී පාද වන්දනාවේ යෙදුන බැතිමතුන් වෙනුවෙන් ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් විසින් දන්සැලක් සංවිධානය කරන ලදී. ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ උපදෙස් මත එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් මෙම දන්සැල ශ්‍රී පලාබද්දල ඓතිහාසික රජමහා විහාරස්ථාන පරිශ්‍රයේදී පවත්වනු ලැබීය.

# රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් මත එම සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 16 වන දින විජයබාහු රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඇතුළු එම රෙජිමේන්තු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් එක්වූහ.

# අයිස්ක්‍රීම් දන්සැලක්





කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිමාලි රණතුංග මහත්මියගේ අදහසකට අනුව ශ්‍රී සම්බුද්ධ ජයන්ති වෙසක් තෙමඟුල නිමිතිකොටගෙන අයිස්ක්‍රීම් දන්සැලක් පසුගිය මැයි මස 26 වන දින කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන දොරටුව අභියස දී පැවැත්විණ. මෙම පුණ්‍ය කටයුත්තට කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති හා 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ පූර්ණ මගපෙන්වීම මත එම රෙජිමේන්තුවේ නිලධාරීන්, සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් හා සෙසුනිලයින් දායකත්වය දුන්හ.

## ගර්භණී කාන්තාවන් වෙනුවෙන් මාහැඟි පරිත්‍යාගයක්



විශේෂ බලකායේ රාජකාරී නියුතු සෙබළුන්ගේ ගර්භණී භාර්යාවන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනෝජා පීරිස් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැත්විණ. මෙම අවස්ථාවට විශේෂ බලකායේ සෙබළුන් සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

## සුබ මොහොතින් රාජකාරි අරඹමින්



සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ප්‍රසාදිනී රණසිංහ මහත්මිය (වම්පස) ඉකුත් අප්‍රේල් මස 20 වන දිනට යෙදුණු සුබ මොහොතින් රාජකාරි අරඹනු ලැබුවාය.

## ගර්භණී මව්වරුන් වෙනුවෙන් පරිත්‍යාගයක්






2(සෙව්) සේවා බලකායේ සේවයේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ ගර්භණී භාර්යාවන් වෙනුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 04 වන දින ක්‍රියාත්මක කරනු ලැබිය. එහිදී, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත ගර්භණී මව්වරුන් 45 දෙනකු වෙනුවෙන් ළදරු භාණ්ඩ පරිත්‍යාග කෙරිණි. තවද, රිජ්වේ ආර්යා ළමා රෝහලේ විශ්‍රාමලත් හෙද නිලධාරිනී කේඩීඅයි පෙරේරා මහත්මිය විසින් "මව්වරුන්ගේ ප්‍රසව හා පශ්චාත් ප්‍රසව තත්ත්වයන්" යන තේමාව ඔස්සේ දේශනයක්ද, සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවක් වන වෛද්‍ය මනෝරි මාරසිංහ මහත්මිය විසින් මව්කිරි දීම පිළිබඳ දේශනයක් ද පවත්වනු ලැබූහ. මෙම අවස්ථාව සඳහා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මිය, එම බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ගර්භණී මව්වරු පිරිසක් එක්වූහ.

# අපේක්ෂා රෝහලට පරිත්‍යාගයක්





මහරගම අපේක්ෂා රෝහලේ රෝගීන්ගේ සුවපහසුව සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව විසින් එම රෝහලේ ප්‍රතිකාර ලබන කාන්තා රෝගීන් 350 දෙනකු සඳහා ඇඳ ඇතිරිලි, කොට්ට උර, තුවා සහ තවත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් මස 27 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වෛද්‍ය නිල්මිණි ප්‍රනාන්දු මහත්මිය ඇතුළු එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් එක්වූහ.

# මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ සංචාරයක





යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඉකුත් මැයි මස 25 වන දින මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ සංචාරයක නිරතවූහ. මෙහිදී, එම ආයතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් සමඟ සුහද පිළිසඳරක නිරතවෙමින් ඔවුන් හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමක්ද සිදුකෙරිණ. තවද, එම රෝහලේ වාට්ටුවක ප්‍රතිසංස්කරණ කටයුතු ද ආරම්භ කරනු ලැබීය. මෙම සංචාරයේදී එම රෝගීන් හට දිවා භෝජන සංග්‍රහයක්ද පිරිනමනු ලැබීය. මෙම අවස්ථාවට යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉරේෂා ප්‍රනාන්දු මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ පිරිසක් එක්වූහ.

# දියතලාවට නව නිවාඩු නිකේතනයක්





විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව මගින් දියතලාව ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ "Blue Bell Monarch" නිවාඩු නිකේතනය ඉකුත් අප්‍රේල් මස 22 වන දින එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ සුරතින් විවෘත කෙරිණි. 2(සේව) විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ හටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ මෙම නිවාඩු නිකේතනය විවෘත කිරීමේ අවස්ථාවට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මෙන්ම විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් ද එක්වූහ.

# හිසට පියසක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා 75 වන සංවත්සරය වෙනුවෙන් යුද්ධ හමුදාවේ අභිමානය හා කීර්තිනාමය ඉහළ නංවාලීමේ අරමුණින් නිවසක් නොමැති පවුලක් සඳහා නිවසක් ඉදිකරදීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය විසින් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පානළුව කඳවුර පිහිටි කුඩළුවිල ග්‍රාමයේ තෝරාගත් දිළිඳු පවුලකට අයත් වාසයට නුසුදුසු නිවසක් අළුත්වැඩියා කර එම නිවැසියන් වෙත භාරදීම ඉකුත් මැයි මස 30 වන දින පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. එම සත්කාරය ප්‍රදේශයේ දානපතීන්ගේ මූල්‍ය දායකත්වයෙන් 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය සහ 2 (සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදුකරනු ලැබූහ. විධායක ජෙනරාල් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ආචාර්ය හිමාලි නියංගොඩ මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම සත්කාරය සිදුකෙරිණ.

# ගර්භණී සෙබළියන් වෙනුවෙන් පරිත්‍යාගයක්





කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මහත්මියගේ ප්‍රධානත්වයෙන් 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ගර්භණී සෙබළියන් වෙනුවෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 14 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට එම ඒකක අණදෙන නිලධාරී මේජර් එම්පී සිංහාරගේ ඇතුළු කාන්තා සෙබළියෝ පිරිසක් එක්වූහ.

# කෘත්‍රිම අත් පා ප්‍රදානය කිරීමේ වැඩසටහනක්





15 වන ජාතික රණවිරු දින සැමරුමට සමගාමීව කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ මූලිකත්වයෙන් කෘත්‍රිම අත් පා බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි මස 19 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. විවිධ ස්වභාවික විපත්වලින් විපතට පත් කරන්දෙණිය සහ ඒ අවට ගම්මානවල වැසියන් හට සහාය දැක්වීමට සහ මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් මානුෂීය මෙහෙයුමට දායක වී අත් පා අහිමි වූ වීරෝදාර රණවිරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය සඳහා රුද්‍රිගෝ මහත්මිය, Friends in Need Society සංගමය සහ කැපිටල් සිටි රොටරි සමාජයේ සියලුම සාමාජිකයින්ගේ අනුග්‍රාහකත්වයෙන් කෘතිම පාද 27 ක් පරිත්‍යාග කරනු ලැබීය. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) අණ්ඩපති මෙන්ම කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී, එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වරුණි කුලතුංග මහත්මිය, එහි මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# වෙල්ලමුල්ලිවයික්කාල් වලින් පසු

## යුද්ධ හමුදාවේ භූමිකාව











මව්වරුන්ට පියවරුන්ට තම දරුවනුත්, බිරින්දෑවරුන්ට තම සැමියනුත් සැමියන්ට තම බිරින්දෑවරුනුත්, දරුවන්ට සිය මව්පියනුත් අහිමිකළ යුද්ධයේ කටුක කර්කශ බව යළි යළිත් මෙරට වැසියන්ට සිහිකළ යුතු නැත. ඒ කර්කශ කඨෝර යුද්ධය ශ්‍රී ලංකාව වෙළාගත් අඳුරු දශක තුන නිමාවූයේ 2009 මැයි මස 18 වැනිදාය. ඒ ශ්‍රී ලංකා ඉතිහාසයේ ස්වර්ණමය දිනයක් රන් අකුරින් සනිටුහන් කරමිනි. එදා 1975 වර්ෂයේ දී යාපනය නගරාධිපති ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා ඝාතනය කරමින් වේලුපිල්ලේ ප්‍රභාකරන් අපේ මව්රටට උරුම කළ අඳුරු යුගය නිමාකරමින් ලැබූ මේ ජයග්‍රහණය මල් යහනා මතින් ලැබූ ජයග්‍රහණයක් නොවේ. එය දහස් ගණනකගේ ලේ කඳුළු මතින් උරුම වූ ජයග්‍රහණයකි.

දෙමළ සටන්කාමීන් කියාගත් වෙලුපිල්ලේ ප්‍රභාකරන්ගේ සහචරයන් විසින් යුද්ධ හමුදා සොල්දාදුවන් 13 දෙනකු 1983 වර්ෂයේ දී ඝාතනය කිරීමේ සිද්ධිය පාදක කරගමින් පළමු ඊළාම් යුද්ධය ආරම්භ විය. 1984 වර්ෂයේ සිට ප්‍රභාකරන්ගේ සහචරයින් විසින් උතුරු පළාතේ

සිංහල ජානපදිකයින් සමූල ඝාතනය කිරීම ආරම්භ කළ අතර, ඊට අමතරව කොළඹ අනුරාධපුර ප්‍රදේශ ඉලක්ක කරගනිමින් ත්‍රස්තවාදීන් ක්‍රියාත්මක වූහ. ඉන් අනතුරුව තිම්පු සාකච්ඡා ක්‍රියාත්මක වුවද එම සාකච්ඡා සාර්ථක නොවීය.

1995 අප්‍රේල් 19 දින ත්‍රස්තවාදීන් විසින් ත්‍රිකුණාමලය වරායේ නැංගුරම් ලා තිබූ නාවික හමුදාවට අයත් නෞකා දෙකක් විනාශ කිරීමත් සමග තුන්වැනි ඊලාම් යුද්ධය ආරම්භ විය. ඉන්පසු ත්‍රස්තවාදීන්ට එරෙහිව රිවිරැස, රණගොස, ජයසිකුරු ආදී ක්‍රියාන්විත රජයේ හමුදාවන් විසින් දියත් කළ අතර 2001 වර්ෂයේ දී යළි සටන් විරාමයක් ඇතිවිය. මෙය 2003 දක්වා පැවති අතර 2006 වසරේදී සාම සාකච්ඡා ක්‍රියාත්මක වුවත් ඒවාද අසාර්ථක විය. 2006 වසරේදී රජයත් එල්ටීටීඊ සංවිධානයත් අතර විටින් විට යුද ගැටුම් ඇතිවිය. ඉන් අනතුරුව 2006 ජූලි 26 දින සිව්වන ඊලාම් යුද්ධය ආරම්භ වූ අතර මේ සඳහා යුදබිමේ නායකත්වය එවකට යුද්ධ හමුදාධිපති ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා විසින් ලබාදුනි.

> ❝ එදා එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් මෙරට මුදාගනිමින් දේශය එක්සේසත් කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු කළාමෙන් යුද ජයග්‍රහණයෙන් වසර පහළොවක් සපිරෙන මාහොතේදීත් රටේ අවශ්‍යතාවය වෙනුවෙන් දිවිපරදුවට තබා ඉදිරියට පැමිණ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය අනුපමේය ජාතික මෙහෙවර ඉටුකරන්නේ රට ආර්ථික සහ සමාජීය මෙන්ම සංස්කෘතිකමය කිසිවකුටත් නොදෙවෙනිව ලෝකය ඉදිරියේ ශක්තිමත්ව නගාසිටුවීමේ කර්තව්‍යයත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තම වගකීමක් සේ සලකන නිසාවෙන්ය ❞

මෙය හුදෙක්ම මානුෂීය මෙහෙයුමක් වූ අතර නැගෙනහිර මානුෂීය මෙහෙයුම නමින් එය හැඳින්වීය. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් 2006 ජූලි 21 දා මාවිල්ආරු සොරොව්ව වසා දමමින් අහිංසක සිවිල් වැසියන් 30000ක පමණ පිරිසගේ ජල සැපයුම අත්හිටවූ අතර මාවිල්ආරු මුදාගනිමින් ජනතාවගේ ජල අවශ්‍යතාවයන් සැපිරීම වෙනුවෙන් සිව්වන ඊලාම් යුද්ධය ආරම්භ විය. ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට ඉතා පහසුවෙන් මාවිල්ආරු මුදාගත හැකි වූ අතර, ඉන් අනතුරුව එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ බලකොටුවක් වූ තොප්පිගල මුදාගැනීමෙන් අනතුරුව නැගෙනහිර පලාතේ එල්ටීටීඊ බලය සහමුලින්ම ඉවත්කර නැගෙනහිර පළාත මුදාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාවන්ට හැකිවිය.

නැගෙනහිර ජයග්‍රහණයෙන් පසුව එල්ටීටීඊ ත්‍රස්තවාදීන් උතුරු පලාතට පමණක් සීමා වූ අතර, උතුරු පළාත ත්‍රස්තවාදීන්ගෙන් මුදාගැනීම සඳහා වූ උතුරු මානුෂීය මෙහෙයුම ඇරඹුණේ ඉන් අනතුරුවය. සාම්ප්‍රදායික යුද උපක්‍රම පසෙකට දා මෙරටටම ආවේණික වූ යුද උපක්‍රමයන් ඔස්සේ ඇරඹුණු උතුරු මානුෂීය මෙහෙයුම එල්ටීටීඊ සංවිධානයේ අවසානය උදාකරවීය. එල්ටීටීඊ සංවිධානය සතුව තිබූ අවසන් බිම් අඟලත් වෙල්ලමුල්ලිවයික්කාල් ප්‍රදේශයේදී අත්පත් කරගැනීමත් සමග 2009 මැයි මස 19 වන දින අති බිහිසුණු ත්‍රස්තවාදය පරදා ප්‍රභාකරන් නමැති ඝාතකයාගේ මළසිරුර නන්දිකඩාල් කලපුවෙන් හමුවූයේ සාමයේ පරෙවියන්ට මුළු ශ්‍රී ලංකා අහස් තලයම යළි විවර කර දෙමිනි.

ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් සහ සෙසු නිලයින් තිස්දහසකට ආසන්නව තුවාල ලැබූ අතර නවත් විසිපන්දහසකට ආසන්නව ජීවිතක්ෂයට පත්වූ සහ අතුරුදන්වූවන් අතරට එක්වූහ. ඔවුන් මේ මොහොතේ සිහිපත් කළ යුතුමය. මේ වීරුවන් කළ කැපකිරීමේ හේතුවෙන් පරම වීර විභූෂණ පදක්කම් 29ක්, වීරෝදාර විභූෂණ පදක්කම් 18ක්, වීර වික්‍රම විභූෂණ පදක්කම් 312ක්, රණ වික්‍රම පදක්කම් 5101ක් සහ රණශූර පදක්කම් 27671ක් සමග වීර ක්‍රියා පදක්කම් 33131ක් හිමිගත්වා ඇත.

යුද්ධය අවසන් වූ පසුවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය මෙහෙවර දශමයකිනුදු අඩු කළේ නැත. ඔවුන් සිය මෙහෙවර අඛණ්ඩව රට වෙනුවෙන් ඉටුකිරීමට පෙරට ආහ. තම රට වෙනුවෙන් පෙරට ඒමට ඔවුන්ට දිවා රෑ, අව්ව වැස්ස ගැටලුවක් වූයේ නැත. ඒ සැබෑම ජාතියේ ආරක්ෂකයාගේ භූමිකාවයි.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේ මූලික රාජකාරියෙන් ඔබ්බට ගොස් සෞඛ්‍ය සේවා, යටිතල පහසුකම් දියුණු කිරීම, අධ්‍යාපන පහසුකම් සැපයීම්, කෘෂිකාර්මික කටයුතු, ආගමික සහ සංස්කෘතික සහජීවන වැඩසටහන් විනෝදාස්වාද කටයුතු, ආදිය සිදුකරමින් ජාතිය ගොඩනැගීමේ කටයුතුවලදී ද පෙරමුණ ගත්හ.

එමෙන්ම, ගංවතුර හදිසි නායයාම් ආදී ස්වභාවික විපත්වලදී අන් කවරකුටත් පෙරාතුව ජනතාව වෙනුවෙන් පෙරට එන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවයි. කොස්ලන්ද - මීරියබැද්ද සහ මාවනැල්ල රාමසර කන්ද නාය යාම, මීතොටමුල්ල කුණු කන්ද නායයාම, ගංවතුර, ලැව්ගිනි ආදී මහජනතාවට දැවැන්ත හානියක් සිදුකළ වූ ස්වභාවික ව්‍යසන සියල්ලකම පාහේ යුද්ධ හමුදාව ඉටුකළ මෙහෙවර ජනතාව හා හමුදාව අතර සුවිශාල මානුෂීය බැඳීමක සහ අවබෝධයක ශක්තිමත් පදනමක් ගොඩනැගීය.

එපමණක්ද නොව හිසට සෙවණක් නොමැති ආර්ථික අපහසුතාවලින් පෙළෙන පවුල්වලට යුද්ධ හමුදාව විසින් දිවයින පුරා නිවාස දහසකට වැඩි ප්‍රමාණයක් මේ වනවිට ඉදිකරදී අවසන්ය. ක්‍රියාත්මක මට්ටමේ පවතින නිවාස ව්‍යාපෘතිද විශාල ප්‍රමාණයකි. මෙහි සුවිශේෂීම කාරණය වන්නේ ඒ ඉදිකරදී ඇති නිවාස ප්‍රමාණයෙන් නිවාස 780කට වැඩි ප්‍රමාණයක් ඉදිකර දී ඇත්තේ උතුරු පළාතේ ජනතාව වෙනුවෙනි. මෙම නිවාසලාභීන් අතර හිටපු එල්ටීටීඊ සාමාජිකයන්ද අතිවිශාල ප්‍රමාණයකි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලොව මානුෂීයම හමුදාව ලෙසින් අබිසෙස් ගැන්වෙන්නේ ඔවුන් සිය සතුරාට පවා මානුෂීයත්වය බෙදාහරින නිසාවෙනි.

එසේම, උතුරේ මෙන්ම දකුණේද රෝහල්වල හදිසි අවශ්‍යතා රුධිර



සැපිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව එක්සත්ව ඉදිරිපත්ව සිටී. ගතවූ වසර කිහිපය තුළ පමණක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සංවිධානය කළ එවැනි ලේදන්දීමේ ව්‍යාපෘති තුළින් රුධිරය පයින්ට් 6000කට වැඩි ප්‍රමාණයක් පරිත්‍යාග කර ඇත.

යුද්ධය අවසන් වීමෙන් පසුව උතුරු නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීමට රජය විසින් දියත් කළ විවිධ වූ වැඩසටහන්වලදී යුද්ධ හමුදා සාමාජිකයින් දැක් වූ දායකත්වය අප්‍රමාණය. උතුර නැගෙනහිර සංවර්ධන කාර්යයේදී යුද්ධ හමුදා සමාජිකයින් විසින් හෙළූ දහඩිය ප්‍රමාණය මූල්‍ය වශයෙන් ගණනය කළ නොහැකි තරමේ වටිනාකමක් විය හැක.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පාසැල් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධන වෙනුවෙන් දියත් කරන ව්‍යාපෘති ප්‍රමාණය අතිවිශාලය. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබාදීම මෙන්ම අධ්‍යාපනික උපකරණ ලබාදීම යුද්ධ හමුදාව තුළ ක්‍රියාත්මක කරනවා සේම ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන් වෙනුවෙන් යුද්ධ හමුදාවෙන් දිවයින පුරා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇත. දිවයින පුරා ස්ථාපිත යුද්ධ හමුදා කඳවුරු ආශ්‍රිතව සිටින ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන මේ ව්‍යාපෘති යුද්ධ හමුදාව විසින් සංවිධානය කරන්නේ කිසිදු ආකාරයක ලාභාපේක්ෂාවකින් තොරවය.

එසේම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක මෙහෙයුම්වල සහභාගී වීමෙන් ශ්‍රී ලංකාවේ හමුදාවන් වෙත ජාත්‍යන්තරයේ සුවිශේෂී කීර්තිනාමයක් අත්පත්කර ගෙන ඇත. ශ්‍රී ලංකාව ත්‍රස්තවාදය පරාජය කිරීමේදී ලබාගත් පන්නරය මුසුකරමින් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී ඉටුකිරීම මගින් මෙරටට විශාල විදෙස් විනිමය ප්‍රමාණයක් වාර්ෂිකව උපයාදීමද සිදුකරයි.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සියධුරයේ රාජකාරී ආරම්භ කිරීමෙන් අනතුරුව මෙරට කෘෂිකර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් අවශ්‍ය සියලුම පියවර ගන්නැයි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ වෙත භාරදුන් වගකීමට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යුද්ධ හමුදා කෘෂිකර්ම සහ පශු සම්පත් බලකාය සහ යුද්ධ හමුදා කෘෂි අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ මේ වනවිට විශාල ව්‍යාපෘති රැසක් ආරම්භ කර ඇත. විශේෂයෙන්ම යුද්ධ හමුදාව විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙල්ලන්කුලම්, මැණික්ෆාම්, ආඩියාපුලියන්කුලම්, නිරාවිය, කන්දකාඩු, ගල්කන්ද, බළල්ල, යාල පලදුපාන ගොවිපළ සහ අරලගන්විල කෘෂිකර්ම පුහුණු පාසල, යුද්ධ හමුදා මූලස්ථාන කෘෂි ව්‍යාපෘතිය, කොහිලවගුරවත්ත රෙජිමේන්තු ගොවිපළ මෙන්ම සියලු යුද්ධ හමුදා කඳවුරු ආශ්‍රිතව කෘෂිකර්ම සහ පශු සම්පත් බලකාය වෙතින් කෘෂිකර්ම ව්‍යාපෘතින් ආරම්භ කර ඇත. ඒ හරහා කෘෂි කර්මාන්තයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සුවිශාල සක්‍රිය දායකත්වයක් දක්වයි.

නීතිවිරෝධී මත්ද්‍රව්‍යය ආශ්‍රිත වැටලීම්වලදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය මෙහෙයුම් සහ බුද්ධි ආවේක්ෂණ රාජකාරිවලින් රැස්කරගන්නා බුද්ධි තොරතුරුවලට අනුව පොලිසිය සහ විශේෂ කාර්ය බලකාය විශාල වැටලීම් ප්‍රමාණයක් සිදුකර ඇත. පසුගිය 2020 වසරේ සිට මේ දක්වා කාලය තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලබාදුන් බුද්ධි තොරතුරුවලට අදාළව පොලිසිය සහ විශේෂ කාර්ය බලකාය වැටලීම් 3445ක් සිදුකර ඇති අතර, එහිදී සැකකරුවන් 4168 ක් අත්අඩංගුවට ගෙන ඇත. එසේම යුද්ධ හමුදාව විසින් ලබාදුන් බුද්ධි තොරතුරුවලට අනුව 2020 වසරේ සිට මේ දක්වා පොලිසිය සහ විශේෂ කාර්ය බලකාය විසින් හෙරොයින් කිලෝග්‍රෑම් 35 කට අධික ප්‍රමාණයක්, අයිස් කිලෝග්‍රෑම් 40 කට ආසන්න ප්‍රමාණයක්, කේරළ ගංජා කිලෝග්‍රෑම් 4600 කට අධික ප්‍රමාණයක්, ගංජා කිලෝග්‍රෑම් 3692 කට අධික ප්‍රමාණයක් සහ ගංජා පැළ 1,819,531 ක ප්‍රමාණයක් අත් අඩංගුවට ගෙන ඇත. එසේම, මේ වනවිට පොලිසිය විසින් ක්‍රියාත්මක කරන යුක්තිය මෙහෙයුමට සමගාමීව නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙහෙයුම් සහ බුද්ධි ආවේක්ෂණ රාජකාරි පුළුල් කරන ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ ආරක්ෂක සේනා ආඥාපතිවරුන්ට සහ අදාළ සියලුම පාර්ශ්වයන්ට උපදෙස් ලබාදී ඇත.

මේ සියලුම කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉටුකරන්නේ තම මූලික රාජකාරී ඒ ආකාරයෙන්ම ඉටුකරමිනි. 2009 වසරේදී යුද්ධය අවසන්වුවත් මේ දක්වා එල්ටීටීඊ සංවිධානය විදෙස්ගතව සිටින සිය සහචරයන් යොදාගනිමින් අවස්ථා කිහිපයකදී ප්‍රතිසංවිධානය කිරීමට උත්සාහ දරා තිබුණත් ඒ සෑම අවස්ථාවකදීම එම උත්සාහයන් මැඩපවත්වා ඊට අදාළ පාර්ශ්ව වෙත නීතිය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය බුද්ධි තොරතුරු යුද්ධ හමුදාව විසින් ලබාදී තිබීම යුද්ධ හමුදාව සිය මූලික රාජකාරීන් කිසිදු අයුරකින් පසුබෑමකට ලක්කර නොමැති බවට වූ හොඳම උදාහරණයයි. එසේම, නිරන්තරයෙන් වෙනස්වන ආරක්ෂක භූ දර්ශනය තුළ ඊට මුහුණ දීමට අවශ්‍යය කාර්යක්ෂම, පුහුණුවලත් වෘත්තීයමය හමුදාවක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉටුකරන්නේ අනුපමේය මෙහෙවරකි.

එදා එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් මෙරට මුදාගනිමින් දේශය එක්සේසත් කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු කළාමෙන් යුද ජයග්‍රහණයෙන් වසර පහළොවක් සපිරෙන මොහොතේදීත් රටේ අවශ්‍යතාවය වෙනුවෙන් දිවිපරදුවට තබා ඉදිරියට පැමිණ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය අනුපමේය ජාතික මෙහෙවර ඉටුකරන්නේ රට ආර්ථික සහ සමාජීය මෙන්ම සංස්කෘතිකමය කිසිවකුටත් නොදෙවෙනිව ලෝකය ඉදිරියේ ශක්තිමත්ව නගාසිටුවීමේ කර්තව්‍යයන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තම වගකීමක් සේ සලකන නිසාවෙන්ය.



සටහන-:
**ලුතිනන් දිලංක ගුණතිලක**
**ජනමාධ්‍ය හා මව්මේඅම්**

# අමතක වන්නේ ඇයි?



කොයි කාටත් යම් යම් දේ අමතක වෙයි. ඇතැම් අයට දුබලතාවය වැඩි වශයෙන් බලපාන අතර, තවත් අයකුට ඉඳහිට කලාතුරකින් එය සිදුවේ. මනෝවිද්‍යාඥ "සිග්මන් ෆ්‍රොයිඩ්" කියන අන්දමට අමතකවීම යනු මොලයේ මතක ගබඩාව හෙවත් යටිහිත තුළ තැන්පත් වන මතක සටහන් අවදිකර ගැනීමේ ප්‍රමාදයයි.

එය කෙනකුගේ බුද්ධි ශක්තිය හා සම්බන්ධ කර දැක්වීමට ඇතැම් අය උත්සාහ ගනිතත් ෆ්‍රොයිඩ් ඒ මතය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරයි.

බුද්ධි ශක්තිය අතින් ඉහළම තලයක පසුවන අයටද බොහෝවිට මේ දුබලතාව බෙහෙවින් බලපා ඇති බව පෙනේ. ජෝර්ජ් බර්නාඩ් ෂෝ, බර්ට්‍රන්ඩ්, රසල් අයන්ස්ටීන් වැනි ශ්‍රේෂ්ඨ ගණයේ ලේඛකයන්, දාර්ශනිකයින්, චින්තකයන් මේ දුබලතාවයෙන් පෙළුන බව ඔවුන්ගේ දෛනික ජීවිතයේ පැවැත්ම තුළින් අනාවරණය වී තිබේ.

බර්නාඩ් ෂෝ ඇතැම් අවස්ථාවල දහස් ගණන් රථවාහන එහා මෙහා ධාවනය කෙරෙන මහාමාර්ග මැද්දේ නිදැල්ලේ ගමන් කළ බවද, ඔහු ගැන දන්නා රියදුරුන් තම රථවාහන පරිස්සමින් අයින් කරගෙන ධාවනය කළ බවද කියනු ලැබේ.

ෆ්‍රොයිඩ්ගේ මතය අනුව අමතකවීමට මුල්වන ප්‍රධාන හේතූන් දෙකක් වේ. එකක් නම් කිසියම් වෙනත් කරුණකට මුළුමනින්ම සිත නතුකරගැනීමයි. අනිත් හේතුව තමන්ගේම යටිසිත විසින් යම් දෙයක් ඕනෑකමින් ප්‍රතික්ෂේප කිරීමයි.

තමන්ට ප්‍රියමනාප නොවන නැතිනම් අප්‍රසන්න සිද්ධියක් මතක ගබඩාවෙහි තැන්පත් කර තබාගන්නට කෙනකුගේ යටිසිත තුළින් එතරම් අනුබලයක් නොලැබේ. තමන් ඇසුරු කරන්නන් අතරේ තමාට එතරම් අවශ්‍ය නොවන අප්‍රසන්න ගණයේ තැනැත්තන් පිළිබඳ තොරතුරු නම්, ගම් නිරායාසයෙන්ම අමතක වේ. එය සිතා මතා කරන දෙයක් නොවන යටි සිත විසින් නොදැනුවත්වම කරනු ලබන දෙයක් බව ෆ්‍රොයිඩ් කියයි.

සාමාන්‍යයෙන් වයස්ගත පුද්ගලයන් අතර අමතකවීම බහුල වශයෙන් දක්නා ලැබේ. මෙය ස්වභාවිකව බලපාන කායික දුබලතාවට අදාලව මොලය හා සම්බන්ධ ස්නායු ක්‍රියා පද්ධතියේ ක්‍රියාකාරීත්වය හීනවීමෙන් හටගන්නකි. එහෙත්, වයසින් ලාබාල තරුණ වියේ පසුවන අය මේ උවදුරට ගොදුරු වන්නේ හෝමෝන හා සම්බන්ධ කායික දුබලතා පදනම් කොටගෙන යයි වෛද්‍ය විද්‍යාඥයෝ සඳහන් කරති.

මනෝවිද්‍යාඥයන්ගේ පිළිගත් මතය වන්නේ අමතක කළයුතු දේ අමතක කරවන, චෛතසික ස්වභාවය මෙහිදී වඩාත් ඉස්මතු වන බවය. එහෙත්, මතක තබාගත යුතු දේ අමතක වන්නේ ඇයි? මීට පිළිතුරු සපයන ෆ්‍රොයිඩ් මෙසේ කියයි.

කෙනකුගේ මතක ගබඩාවට, එනම් යටිසිතට යමක් වැද්ද ගන්නේ ඒ දෙය නැතිනම් කරුණ හා අත්වැල් බැඳගත් වෙනත් කරුණු කිහිපයක්ද සමගිනි. යමක් මතකයේ රඳවා ගැනීමේදී මෙය ප්‍රයෝජනයට ගත හැකිවේ. පොතපත පාඩම් කිරීමේදී වුවද එහි වැදගත්ම කොටස් අමතක නොවන පරිදි සිතට කාවද්දන්නේ ඒවාට යා කරගන්නා පරිවාරක කරුණුවලට අදාළවය.

'මිහිර' 1997 අගෝස්තු



# අන්තිම වෙඩිල්ලට අවුරුදු 15

යුද සමයේ සැඟවුණු කතාවක්

මෙරට පැවති තිස් අවුරුදු යුද්ධය නිමාකොට වසර 15ක් සපිරුණු ඓතිහාසික දිනය ඉකුත් මැයි මස 19 වන දිනට යෙදී තිබුණි. සෑම වර්ෂයකම මෙම දිනය ආසන්නවත්ම සමාජය තුළ ඒ පිළිබඳ යම් පිබිදීමක් දැකගතහැකි වුවද දැන් දැන් එය ක්‍රමානුකූලව අවරෝහණය වෙමින් ඇති බවක් පෙනේ. යුද ජයග්‍රහණය සැමරීම පිළිබඳ වර්තමානය වනවිට

දකුනෙත් සමාජය තුළ විවිධ අර්ථකථන පවතී. ඇතැමුන් එය උත්කර්ෂයෙන් සමරද්දී තවකෙක් එය තවත් එක් දිනයක් ලෙස පමණක් සලකති. ඒ අතරම ඒ පිළිබඳ කිසිදු වගක් නොමැතිව සිටින පිරිසක්ද එම යුද්ධ ජයග්‍රහණය අවතක්සේරු කරමින් එය හෙලා දකින සුළුතර පිරිසක්ද නැත්තේ නොවේ. කෙසේ වුවද, යථාර්ථය නම්, පැවති අභාග්‍යසම්පන්න යුද්ධය නිමාවීම පිළිබඳ සතුටු නොවන අයකු සිටිතැම් ඔහු හෝ ඇය සිහිකල්පනාව ඇති අයකු විය නොහැකිය. සෘජුව හෝ වක්‍රව යුද්ධයෙන් බැට කෑ කිසිවකුට හෝ නොඑසේනම් යුද්ධයේ ආදීනව පිළිබඳ මැදහත්ව විමසිලිමත් වූ කෙනකුට යුද්ධය අවසන් වීම පිළිබඳ අප්‍රමාණ සතුටක් සැහැල්ලුවක් මිස අන් යමක් නොදැනේ.

ගෙවුණු වසර 15 තුළ (අවාසනාවන්ත පාස්කු ප්‍රහාරය නොවෙන්නට) සමස්තයක් ලෙස අප රට තුළ ත්‍රස්තවාදය හේතුවෙන් කිසිදු අවි ගැටුමක් වාර්තා නොවිය. කුමන සමාජ ආර්ථික දේශපාලනික අස්ථාවරභාවයන් පැවතියද සාමය හා නිදහස සෑම ජන වර්ගයකටම අයත් වූවන්ට භුක්ති විඳීමේ ඉඩකඩ පැවතිණ. නමුත්, එය ඉබේ සිදුවූවක් නොවුණු අතර රණවිරුවන් ලේ කඳුළු දහඩිය හෙලා දිවිහිමියෙන් උදාකර ගත්තක් බැව් මෙහිලා අවධාරණය කරනු වටී. යුද්ධය නිමකර 15 වසක් ගෙවුණු මේ ඓතිහාසික දිනයේ රණවිරුවන් යනු කවුරුන්ද යුද බිමක ස්වභාවය කෙබඳුද මරණය හමුවේ විරුවකුගේ භූමිකාව කෙලෙස විද යන්න පිළිබඳ නව පරපුර තුළ දැනුම්වත්භාවයක් ඇති කරලීමද, පැරණි පරපුර තුළ ස්මරණයක් ඇති කරවීමද කාලීන අවශ්‍යතාවයක් ලෙස දකිමි.

එදවස රණවිරුවන් සටන් වැදුණේ මෙරටේ සියලු ජනකොටස්වලට එරෙහි වූ පොදු සතුරකු සමඟය.

පුද්ගලික අභිමතාර්ථ පසෙකලා පැහැදිලිව පෙණුනු එම සතුරා ඉදිරියේ ඔවුන් සජීව සටන් වැදුණා මිස අන්කිසිවක් නොතැකුවේය. යුද්ධය පැවති එම වකවානුව තුළ නිවසින් එළියට බහින්නට බියෙන් වැඩපලට, කාර්යාලයට යා ගත නොහැකිව තම දූවා දරුවන් පාසලට යැවීමට නොහැකිව දිවි ගෙවූ ජනතාවට නිදහසේ අගය කොතරම් දැයි දැනුණේ ත්‍රස්තවාදය මෙරටින් සදහටම තුරන් කළ පසුවය. නමුත්, යුද්මය කාලයේදී මෙරටේවත් නොසිටි නොඑසේනම් තේරෙන වයස්වල පසු නොවූ ඇතැමුන් වර්තමානයේ හිඳ යුද ජයග්‍රහණය හෑල්ලුවට ලක් කරමින් යුද්ධයක් ඇති වීමට හේතු, එය පෝෂණ වූ අයුරු, සතුරු පාර්ශ්වයේ මානුෂීය මුහුණුවර ආදිය පිළිබඳ බොහෝ දාර්ශනික අදහස් ඉදිරිපත් කරනු පෙනේ. නමුත්, ඔවුන්ද එවක පැවති ක්‍රියාන්විත පරිසරයෙහි ජීවත්ව වූයේ නම්, තේරෙන වයස්වල පසු වූයේ නම් එදවස පිපිරුණු බෝම්බ වෙඩි හඬවල් අතරේ නිසැකවම ඔවුන්ද මරණ බියෙන් සැඟවෙන බවට විවාදයක් නැත. එබැවින් ත්‍රස්තවාදී පිළිලය මෙරටින් සදහටම තුරන් කිරීම පිළිබඳව මෙන්ම ඒ වෙනුවෙන් රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් හා තම ශරීර අවයව කැපකරමින් සිදුකළ අසමසම මෙහෙවර දෙස පක්ෂ, පාට කණ්නාඩි වලින් නොබලා නිසි ගෞරවය හා වටිනාකම ලබාදීම මේ මව්බිමෙහි පා තබන සෑම අයකුම සතු යුතුකම හා අනුලංඝනීය වගකීමක් බැව් මෙහිලා සටහන් කරමි. යුදබිම තුළ තිස්වසරක් පුරා සිදුවූ අප්‍රමාණ, අප්‍රකාශිත සිදුවීම් සමුදාය ගැනිය නොහැකි තරම්ය. ඒ සෑම දෙයකින්ම කියවෙනුයේ රණවිරුවන් රට වෙනුවෙන් කළ කැපවීමේ හා තම ජීවිත වෙනුවෙන් සිදුකළ අසීමිත අරගලයේ ස්වභාවයයි. වෙසෙසින්ම ඔබ එය දැනගත යුතුමය.

2009 මැයි මස ඇරඹෙන්ම උතුරෙහි අවසන් සටන් බිම ගිනියම් වෙමින් තිබුණේ ත්‍රස්තවාදීන් ක්‍රමිකව මුලතිව් එක් පෙදෙසකට තල්ලුකර හරිමිනි. එහිදී, අවසන් විජයග්‍රහණය අපේක්ෂාවෙන් අවසන් සටනට පිවිසි හමුදා භටපිරිස් සටන් වැදුණේ තරඟයට මෙනි. තැන තැන ඇවිලුණු සටන් හමුවේ මියෙන තුවාල ලබන සංඛ්‍යාව කොතරම් වුවද එහි කිසිවෙක් තම ජීවිත ගැන නොතැකූ අතර ඔහුවු සිය අරමුණෙම රැඳී සිටියහ. මේ අතර පුදුකුඩිරුප්පු ප්‍රදේශයේ තැනක තුවාලකරුවන් රැගත් ට්‍රැක්ටරයක් මද්දහනේ හිරු එළියට දිලිසෙමින් අබලන් ගුරුපාරේ වේගයෙන් ඇදෙන්නට වූයේ දූලිවලා නංවමිනි. බැලූ බැල්මටම එහි ටේලරය මත කිහිපදෙනකුම රැඳී සිටි අතර, ඔවුනගේ අපිළිවෙලට විහිදුනු දෑත් දෙපා දුටුවනම එහි වැතිරී සිටිනුයේ තුවාලකරුවන් පිරිසක් බව දුරදීම හඳුනාගත හැකිය. ඊට පිටුපසින් ගිලන් රථයක්ද සටන් පැවති පෙදෙසේ සිට එක එල්ලේම ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත ළඟාවෙමින් තිබුණේ එහිද සැලකිවයුතු තුවාලකරුවන් පිරිසක් සිටින බවට ඉඟි පලකරමිනි.

**"උතුරු නැගෙනහිර සටන් හමුවේ මියගිය දහස් ගණන් රණවිරුවන් රටපුරා මිහිදන් විය. 2009 මැයි 19 වන දිනෙන් පසුව එසේ මිහිදන් වූ පිරිසට කිසිවකුත් අලුතෙන් එකතු නොවූ අතර, සුසාන භූමිවල විරුවන් වෙනුවෙන් ඉදි වූ සොහොන් කොත්ද දිරාපත් වෙමින් ගරා වැටෙමින් තිබේ. සොබා දහමේ න්‍යාය එසේ වුවද තවත් දශක ගණනාවක් යහතින් ජීවත් වීමට තිබියදී ඔබ වෙනුවෙන් රට වෙනුවෙන් මරණයම තෝරාගත් එම අප්‍රකාශිත රණවිරුවන් පිලිබඳව හදවතේ ගැඹුරුම තැනින් කෙලෙහි ගුණ පුදන්නට අදට යෙදෙන මෙම ඓතිහාසික දිනයේ අමතක නොකරමු."**



ඒ වනවිට ඉදිරි සටන් පෙරමුණ තරමටම පුදුකුඩිඉරිප්පු හි පිහිටි එම ප්‍රතිකාර මධ්‍යස්ථානයද අතිශය කාර්යබහුල වී තිබිණ. එහි සිටි වෛද්‍යවරු දෙදෙනාටද හෙද කාර්ය මණ්ඩලයේ සැමටද සෙසු අත් උදව් කරුවන් සැමටද තුවාලකරුවකු වෙනුවෙන්ම තනි තනිව අවධානය යොමන්නට තරම් හේතු පැවතිණ. ඒ අනුව රුධිරය, සේලයින්, ඔක්සිජන් ලබාදීම, වෙළුම් පටි යෙදීම, ශරීර කොටස් ඉවත් කිරීම් හා සුළු සැත්කම් සිදු කිරීම වැනි බොහෝ දෑ පැවරිණ. ප්‍රතිකාර ලබාදෙන කූඩාරම තුළ යකඩ ඇඳන් 10ක් පමණ හා ලී අට්ටාල කිහිපයක්ද පැවති අතර ඒ වන විට ඒ සැම එකකම පාහේ තුවාල කරුවන්ගෙන් පිරී තිබිණ. බරපතල, සාමාන්‍ය හා සුළු තුවාල ලැබූවන් ලෙස වර්ගකර සිටි ඔවුන් අතරින් ජීවිත අවදානම ඉහළ වූවන් කඩිනමින් ගුවන් මඟින් රෝහල් කරා පිටත්කර හැරීමේ කටයුතු ද සූදානම් කෙරිණ. නමුත්, එය ලෙහෙසි පහසු කටයුත්තක් නොවූයේ තුවාලකරුවන් ගුවන් පථය තෙක් රැගෙන යාමටද වල ගොඩැලි සහිත දුෂ්කර මාර්ගයක කිලෝමීටරයකට වැඩි දුරක් පසුකළ යුතුව තිබූ හෙයිනි. අදාළ තාවකාලික ගුවන් පථය කැලෑවෙන් වටවූ එළිමහන් භූමියක ඉදිකොට තිබූ අතර එහි ආරක්ෂාව පිණිස සැලකිය යුතු භට පිරිසක්ද එහි වටා පැය 24 තුළම යොදවා තිබිණ.

ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත අලුතින් රැගෙන ආ තුවාලකරුවන් අතර ඉහත වර්ගීකරණ තුනටම අයත් හමුදා සාමාජිකයෝ රැසක් සිටියහ. ඒ අතරද අත පය ඇතුළු ශරීර කොටස් අහිමි වූ කිහිප දෙනකුම විය. එසේම, ශරීරයේ පෙනෙන තරමට තුවාලයක් නොතිබුනද හිස හා පපු පෙදෙසට වෙඩි උණ්ඩ ඇතුළුව බරපතල තත්ත්වයේ පසුවූවන් කිහිප දෙනෙක්ම ඒ අතර වූ හෙයින්. ප්‍රතිකාර ලබාදීමේදී ප්‍රමුඛත්වය හිමිවූයේ ඔවුනටය. ගිලන් රථයෙන් රැගෙන එන ලද තුවාලකරුවන් අතර තරුණ ලුතිනන්වරයකුද වූයේය. ඔහුගේ පාදයක් කලවා ප්‍රදේශයෙන්ම වෙන්වී තිබූ අතර, එය බැලීමට පවා අපහසු හද දවන දසුනක් විය. නමුත්, පුදුමය වූයේ ඒ වනවිටද ඔහු හොඳ සිහියෙන් පසුවීමය. එහිදී, ඔහු කෑගසමින් විමසූ එකම කාරණය වූයේ "මාව සිහිනැති කරන් නැද්ද, මාව සිහිනැති කරන් නැද්ද" යනුවෙනි. එහිදී, වෛද්‍යවරු වහා වහා මැදිහත්ව ප්‍රතිකාර දෙමින් ඔහුව අස්වසාලන්නට උත්සහ දැරිය.

මේ අතර එම නිලධාරියාගේ කිහිල්ලට යටින් දැත් යවා ඔහුව වත්තම් කරගනිමින් යුද හමුදා සැරයන්වරයකුද ඔහු සමගම රැඳිසිටි අතර ඔහු පැමිණ තිබුණේද තුවාල ලත් එම නිලධාරියා සටන් වැදුණු භූමියේ සිටමය.


මෙලෙස මොහොතක් ගතවන්ම අනපේක්ෂිත යමක් සිදුවූයේය. එනම් එක් වරම එම තුවාලලත් නිලධාරියා තම දෙඅත් ඉහළට ඔසවා තමා වත්තම් කරගෙන සිටි සැරයන්වරයාගේ හිස බදා ගනිමින් ඔහුව අතොරක් නැතිව සිප ගන්නට විය. ඒ සමගම තත්පර කිපයක් තුළදී ඔහුගේ හිස පහලට තඩා වැටී ක්ලාන්ත වූයේ නොසිතූ ලෙසයි. එම අවස්ථාවේ වහා ක්‍රියාත්මක වූ එහි සිටි වෛද්‍යවරයා (යුද හමුදා කපිතාන්වරයා) ඔහු වෙත කෘත්‍රිම ස්වසනය ලබාදෙමින් වහාම ඔහුව ඒ අසල සූදානමින් තිබූ යුනිකෝන් රථයට ඔසවා තබා ගුවන් පථය තෙක් රැගෙන යාමට කටයුතු කරන ලදී. ඒ සමගම හෙලිකොප්ටරයක් ගෙන්වා ගැනීමට අවැසි සම්බන්ධීකරණ කටයුතුද සිදුකෙරිණ.

එම ලුතිනන් වරයාට තුවාල සිදුව තිබී ඇත්තේ උදේ වරුවේය. නමුත්, එහි පැවති උග්‍ර සටන් හමුවේ කොතරම් තුවාල ලැබුවෙක් වුවද සටන් පෙරමුණෙන් පසුපසට ගැනීම අතිදුෂ්කර කටයුත්තකි. කෙසේ හෝ උපක්‍රමශීලීව දැඩි අවධානම් කලාපයෙන් ඔහුව පසුපසට ගෙන ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත රැගෙන එම දක්වා පැය කිහිපයක්ම ගතව තිබිණ. එහිදී, තවත් විශේෂ යමක් සිදුව තිබිණ. එනම් සටන් බිමේ සිටම තුවාලලත් එම නිලධාරී පසුපසට ගෙන ට්‍රැක්ටරයක හා ගිලන් රථයක ආධාරයෙන් ප්‍රතිකාර මධ්‍යස්ථානය කරා රැගෙන ඒම දක්වා මුල් වී ඇත්තේ එම නිලධාරියා සමගම සටන්වැදී සැරයන්වරයෙකි. එහි තවත් විශේෂත්වයක් වූයේ ඔහුත් අදාළ නිලධාරියාත් එකම පාසලක එකම පන්තියේ සගයන් වීමය. වෙන වෙනම යුද හමුදාවට එක්ව තිබුණද ඔවුන් දෙදෙනා රාජකාරී නිරතව තිබුණේද එකම ඒකකයකය. එසේම සටන් බිමෙහිද ඔවුනගේ එම සබඳතා තවදුරටත් සවිමත්ව තිබී ඇති අතර, තම සහෝදර නිලධාරියා තුවාල වූ සැනින් ඔහුව වත්තම් කොට ගෙන තිබුණේද එම සැරයන් වරයාමය. සිහි නැතිවීමට මොහොතකට පෙර එම තුවාලලත් නිලධාරී තම පන්ති සගයා වූ එම සැරයන්වරයා සිපගෙන තිබුණේ එතරම්ම බැඳීමක් ඔවුන් අතර තිබූ හෙයිනි.

මෙලෙස සැලකිව යුතු වේලාවකට පසුව ගුවන් පථය වෙත පැමිණි හෙලිකොප්ටරයක් ආධාරයෙන් එතෙක් වෛද්‍ය මධ්‍යස්ථානයේ සිටි බරපතල තුවාලකරුවන් සියලුදෙනා සමග අදාළ නිලධාරියාද රෝහල කරා රැගෙනයාමට කටයුතු කෙරිණි. නමුත්, එහිදී ඉතා අවාසනාවන්ත ලෙස පෙර කී ලුතිනන් වරයා ජීවිතයෙන් සමුගෙන තිබුණේ එතෙක් ඔහුගේ ජීවිතය රැකදීම වෙනුවෙන් අමතර සටනක නිරත වූ වෛද්‍යවරයාගේ නෙතටද කඳුලක් එක්කරමිනි.

අවසන් සටනෙහි වූ ඉහත සංවේදී සිදුවීම එම භූමියේ වැලලුනු සිදුවීම් අතර එකක් පමණි. තිස්වසක් තිස්සේ පැවති යුද්ධය හමුවේ සමාජයට නිරාවරණය නොවූ මෙවැනි අප්‍රමාණ කතා කොතරම් විද. යුද්ධය පැවති සමයේ රණවිරුවකු මිහිදන් නොකළ සුසාන භූමියක් සොයා ගැනීම කිසිවකු නොමල ගෙයකින් අබැටක් සෙවීමක් වැනි විය. එතරම්ම උතුරු නැගෙනහිර සටන් හමුවේ මියගිය දහස් ගණන් රණවිරුවන් රටපුරා මිහිදන් විය. 2009 මැයි මස 19 වන දිනෙන් පසුව එසේ මිහිදන් වූ පිරිසට කිසිවකුත් අලුතෙන් එකතු නොවූ අතර, සුසාන භූමිවල විරුවන් වෙනුවෙන් ඉදි වූ සොහොන් කොත්ද දිරාපත් වෙමින් ගරා වැටෙමින් තිබේ. සොබා දහමේ න්‍යාය එසේ වුවද තවත් දශක ගණනාවක් යහතින් ජීවත් වීමට තිබියදී ඔබ වෙනුවෙන් රට වෙනුවෙන් මරණයම තෝරාගත් එම අප්‍රකාශිත රණවිරුවන් පිළිබඳව හදවතේ ගැඹුරුම තැනින් කෙලෙහි ගුණ පුදන්නට මැයි 19 වන දිනට යෙදුණු මෙම ඓතිහාසික දිනයේ අමතක නොකරමු.

*තිස් කොට සියලු අණවින සතුරු බිය මැකී*
*කෙස් කොට පවා දන්දී උපන් බිම රැකී*
*රැස් කොට උතුම් පින් එල නිවන් මඟ දැකී*
*පස් යට නිදන පුත තුබ උතුම් රුවනකි*



ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද විජේසිංහ

# පිහිනන්නේ බලාගෙනයි

දියකෙළිය හා පිහිනීම දැන් ඉතා ජනප්‍රියව පවතී. එහෙත්, පීනා යද්දී දිය වැලකට හසුවීම නිසා හෝ හදිසියේ කෙන්ඩා පෙරළීමකින් හෝ විපතට පත්ව ගිලියන අයගේ සංඛ්‍යාව වැඩිවී ඇති බව ජාත්‍යන්තර පිහිනුම් පුහුණු සංසදය මගින් නිකුත් කරන වාර්තාවලින් හෙළිවේ.

මේ තත්වය යටතේ ආරක්‍ෂාව සැපයෙන මූලික උපදෙස් කිහිපයක් ලෝක පිහිනුම් ශූරයකු වන චීන ජාතික වොංගේයි විසින් නිකුත් කර ඇත. පහත පළවන්නේ ඉන් වැදගත්ම කරුණු කිහිපයකි.

## පිහිනීමට සුදුසු වේලාව තෝරාගන්න

හිරු උදාවෙන් පැය දෙකකට පසුව දහවල් 1100 දක්වාද සවස් කාලයේ හිරු බැස යන්නට කලින් සිට ඇඳිරි වැටෙන තෙක්ද පිහිනීම සඳහා යෝග්‍ය කාලයයි. මේ වේලාවන්හි මුහුදේ ජලය දැඩි උණුසුමින්, උෂ්ණත්වයෙන් තොරවන අතරම පමණට වඩා සීතල ගතියක් ද නැත. දවල් දැඩි උණුසුම සහිත වේලාවන්හි පිහිණන්නට යෑමෙන් නිතැතින්ම මස්පිඩු හෙවත් කෙණ්ඩා පෙරළීම වැනි ආබාධ හටගැනීමට ඉඩ තිබේ.

ගැඹුරු මුහුදේ පිහිනීමේදී මෙය බෙහෙවින්ම අනතුරුදායකය.

## සුදුසු ස්ථානයක්

ජීවිතාරක්‍ෂක සේවා ක්‍රියාත්මක වන ස්ථාන පිහිනීම සඳහා තෝරාගැනීම වඩාත් උචිතය. අනතුරු හැඟවීම පිණිස ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු කෙරෙහි අවධානය යොමු කර එහි අඩංගු උපදෙස් පිළිපදින්න. හුපුරුදු තැනක පිහිනන විට මුලින් ජල පත්ලේ පිහිටීම කෙරෙහි සැලකිලිමත් වන්න. ඔබට පුළුවන් දුර ප්‍රමාණයෙන් අඩක් දුර පිහිනා යන්නට වග බලාගන්න. පිහිනා ගෙන යන දුරම ආපසු පීහිනන්නට සිදුවන බව විශේෂයෙන් මතක තබාගන්න.

## අනවශ්‍ය විහිළු එපා !

කණ්ඩායම් වශයෙන් පිහිනීමේදී එකිනෙකා වෙත අනවශ්‍ය විහිළු තහළු කිරීම් තෙරපීම් ඇදගෙනයාම් වැනි දේවලින් වළකින්න. පිහිනීම පිළිබඳව ආධුනිකයකු මෙවැන්නකින් සමබරතාව නැතිවී අමාරුවේ වැටිය හැකි බැවිනි.

හදිසියෙන් මස් පිඩු පෙරළීමක් සිදුවුවහොත්, මුහුණ පහතට හරවාගෙන තදින් හුස්ම ගන්න. අනතුරුව ආබාධිත පෙදෙස වරින් වර පිරිමදින්න. දියවැලකට හසුවුවහොත් එය හා සමග පොර බදනු වෙනුවට දියවැල හා සමග අඩක් හරස් වන අයුරින් මඳ දුරක් ඉදිරියට පිහිනන්න දියවැලෙහි වේගවත් පෙදෙස පසුවීමත් සමග ඔබට ඉන් පිටතට පීනා ගැනීම පහසුය.

"මිහතේ" 1997 අගෝස්තු







# ජයම්පතිගේ කථාව

## රණබිමේ මතක බිඳුවක්...

යුද්ධ හමුදාවේ වසර 30 කට අධික කාලසීමාවක් රාජකාරී කර මැදි වයසද ඉක්මවා ජීවිතයේ සැඳෑසමය වෙත කෙමෙන් ලඟාවෙමින් සිටින මා වැනි සොල්දාදුවකුට ජීවිත කාලය තුළ හමුවී ඇති කථාබස් කර ඇති, සම්බන්ධකම් පවත්වා ඇති සංඛ්‍යාත්මකව දැක්වීමට හැකියාවක් නොමැති හිතමිතුරන් විශාල ප්‍රමාණයක් සිටිති. ඒ අතරින් ඉතා සමීපව රාජකාරී කළ මාගේ රෙජිමේන්තුවට අයත් අයවලුන් විශේෂය. කෙසේ නමුත්, සෙබළ ජීවිතය තුළ එක් එක් පුද්ගලයින් මා හට ඔවුන් පිළිබඳ ජනිත වූ මනුෂ්‍ය හැඟීම් අනුව විවිධාකාර මට්ටමේ මිත්‍ර සන්ධානයන් පැවති බව පමණක් පැවසිය හැක.

ඇතැම් පුද්ගලයින් අප සමග සුවිශේෂී සම්බන්ධකමක් නැතිවද ඔවුන් පිළිබඳ අප හදවත තුළ ලැගුම්ගත් හැඟුම් සමුදායන් පුදුමාකාර අයුරින් කිසිදා අමතක නොවන මතකයන් වශයෙන් තැන්පත් වී තිබේ. මා අද ඔබට පැවසීමට යන කථාවේ කථානායකයාද ඒ අයුරින් මගේ ජීවිතයට සුවිශේෂී මතක සමුදායක් ඉතිරිකර මව්බිම වෙනුවෙන් තම දිවිය පූජාකර අප අතරින් සදහටම නික්ම ගිය අයෙක් බැව් පමණක් පැවසිය හැක.

ජයම්පති ඔහුගේ නමය. ඔහු ගැන මාගේ මතකය වසර 30 ක ඈත අතීතයකට ගෙනයයි. එනම්, 1994 වර්ෂයේ මුල් භාගයේ දියතලාව ස්වේච්ඡා පුහුණු පාසලේ ආධුනික පුහුණුව හදාරා ඒකකය වෙත රපෝර්තු කළ කාලසීමාවය. එවකට මා අයත් බලඇණිය වව්නියාව පූවරසන්කුලම ඉදිරි ආරක්ෂක වළල්ලේ ස්ථානගත වී තිබූ අතර හමුදාවේ සැම අයකුම හොඳින් දන්නා පරිදි ආධුනික සෙබළුන් වශයෙන් අප ජීවිතයේ දුෂ්කරම කාලපරිච්ඡේදයට මුහුණ දෙමින් සිටි කාලවකවානුවයි.

ඒකකයට නවතම්යෙන් පැමිණි ආධුනික සෙබලකුගේ එවක දිනචර්යාව සැමෙවාම දන්නා එකකි. පාන්දර 05 ට පමණ ආරම්භ වී ජ්‍යේෂ්ඨයන්ගේ තේ පානය සූදානම් කිරීම, බංකර් අවට සුද්ධ පවිත්‍ර කිරීම, පසුව ශාරීරික අභ්‍යාස සිදුකර සරඹ හා දේශණ සඳහා සහභාගී වීම බර වැඩ, මුරතැන්ගෙයි රාජකාරී බණ්ඩ මූලස්ථානයට ගොස් ජ්‍යේෂ්ඨ අයවලුන්ගේ ආහාර පාන, තේ රැගෙන ඒම අමතර මුර රාජකාරී වැනි එකී මෙකී නොකී දහසක් කාර්යයන් ඒ අතර වේ. ඒ මදිවට යම් සුළු හෝ අඩුපාඩුවක් දකින්නට ඇස් කීපයක් දවස මුළුල්ලේම අප දෙස යොමුව ඇත. සියල්ලටම වඩා අපහසු හා බියජනක වනුයේ රාත්‍රී මුර රාජකාරියෙහි යෙදීමයි. වව්නියාව රූක්ස වනාන්තර ප්‍රදේශයේ රාත්‍රියට ඇසෙන කුරුල්ලන්ගේ නාද රටා පවා ඇසෙනුයේ ඇඟ කිලිපොලායමිනි.

ඉතා නුදුරුව ඉදිරියේ සතුරා රැක සිටිනුයේ අපගේ සුළු අනපසුවීමකින් ආරක්‍ෂක වළල්ල කඩා බිඳ දැමීමටයි. ඊටත් වඩා බියජනක කරුණ නම් අපගේ ජ්‍යේෂ්ඨයින් අප නිදිබරව සිටීදැයි විමර්ශනය කිරීමට ආරක්‍ෂක වළල්ල දිගේ පැමිණෙන මුර පරීක්‍ෂාවයි. ඇස් පියවී නිදිකිරා වැටීම සතුරා අතින් මරණය කැඳවා ගැනීමක් මෙන්ම ජ්‍යේෂ්ඨයින් හට නිදිකිරා වැටී අසුවීම මරණයට වඩා දරුණු ප්‍රතිවිපාකවලට කැඳවායාමක් වූ අතර, මුර රාජකාරියේ දෑස පියවී ගොස් ජ්‍යේෂ්ඨයින් හට හසුවීම නිසා යුද හමුදාවට බැඳී ඉතා කෙටිකලක් තුළ එම අත්දැකීම් වරක් නොව කිහිප වතාවක්ම විඳගැනීමේ කටුක භාග්‍යය මා හට ලැබුන බවද පවසනුයේ ඉතා අමිහිරි මතකයන් සමගිනි.

ඇත්තෙන්ම ආධුනික සෙබළකු නිසි පරිදි හැඩගස්වා නිර්භීත කාර්යක්‍ෂම සොල්දාදුවන් කිරීමේ පරම වගකීම සාම්ප්‍රදායිකව භාර ගනුයේ අපට වඩා ජ්‍යේෂ්ඨ සාමාන්‍ය සෙබළුන්ය. ඔවුන්ට හමුදාවේ භාෂාවෙන් හඳුන්වනුයේ "සීනියර් ප්‍රයිවෙට්" යනුවෙනි. නමුත්, ඒකකයට පැමිණ ටික කලක් යනතුරු අප ඔවුන් ඇමතිම සිදුකළේ කෝප්‍රල් වශයෙන්ය. ඔවුන්ගේ නමින් ඇමතීම නිවැරදි ක්‍රමය වුවද ඒ සඳහා ධෛර්යය උපදවා ගැනීමට සෑහෙන කලක් ගතවිය.

පෙලහාර කෝප්‍රල්, බණ්ඩාර සැරයන් හා බණ්ඩාර නිලධාරීන් ආධුනිකයින් වන අපහට යම් දයාවක් දැක්වුවද මේ සීනියර් ප්‍රයිවෙට් වරුන්ගෙන් ආධුනික අපහට කිසිදු ගැලවුමක් නොමැති විය. අප කරන සෑම කාර්යයකම දෝෂ දකිමින් අඛණ්ඩ පරීක්‍ෂණයන්ට ලක්කරමින් අපගේ හද යෞවනයේ කෙලිලොල් සිතුම් පැතුම් යුද හමුදාවේ කටුක කර්කශ ජීවිතයට පරිවර්තනය කිරීමට ඔවුන් ගන්නා ලද උත්සාහය එවකට අපට අතිශය දුෂ්කර යැයි හැඟුණ ද එහි ප්‍රතිඵල අප අද සතුටින් භුක්ති විඳිමින් සිටී. එසේ ගුරුහරුකම් දුන් ඇතැමෙක් අද අප අතර නොමැත. ජීවත්ව සිටින අයවලුන් ඉඳහිට හෝ දුරකථනයෙන් අමතා පැරණි රසාංග ගැන දොඩමළු වීමට අමතක නොකරති.

අප කථානායක ජයම්පතිද අයත් වූයේ මා ඉහත සඳහන් කළ සීනියර් ප්‍රයිවෙට් ගොන්නටය. මා ඔහු දුටු පළමු දිනයේදීම දුටු විශේෂත්වය නම් ඔහුගේ බාහිර පෙනුමය. එවකට අප ඒකකයේ රාජකාරී නියුතු බොහෝ සෙබළුන් අනුරාධපුරය, වවුනියාව, පදවිය හා බැඳුනු මායිම් ගම්මානවලින් යුද හමුදාවට එක්ව තිබූ අය වූ අතර, ඔවුන් බොහෝ දෙනා දිගු කාලයක් වවුනියාව කාන්ඨක දේශගුණික තත්ත්වයන් යටතේ ජීවත් වී රාජකාරී කර අව් රශ්මියට හසුවී අඳුරු පැහැ ගත් ශරීර ඇති අයවලුන්ය. එසේ නොමැති අය ඉතා සුළු පිරිසකි. නමුත්, ජයම්පති දුටු පළමු දිනයේදී මා සිතුවේ ඔහු නිලධාරියකුද යන ප්‍රශ්නාර්ථයක් සහිතවය. මන්ද ත්‍රස්තවාදී ප්‍රහාර ඉතා බහුලව පැවති ඒ කාලයේ ඇතැම් නිලධාරීන් තමන්ගේ නිලයට හිමි ලාංඡන නොපැළඳ කැළෑ ඇඳුම් ඇඳීම සිදුවූ බැවිනි. නමුත්, තත්පර කිපයක් තුළ ඔහු නිලධාරියකු නොව සෙසුනිලයකු බව හඳුනා ගන්නද රැලි ගැසුන මනාව කැපූ කොණ්ඩය හා ස්වේත වර්ණ හම මනා කඩවසම් පෙනුම සිනමා නළුවෙකුගේ දර්ශනය මතකයට නැංවීය.

ඔහු අප සිටින ස්ථානයට පැමිණ සිටියේ කිසියම් රාජකාරී කටයුත්තකට බැව් පෙනෙන්ට තිබූ අතර, පෙනුම වෙනස් වුවද හමුදාවට ආවේණික කටයුතුවලදී අනෙකුත් අප දැකීමට අකමැති පුද්ගලයින් හා සමාන බව දැකගත හැකි වූයේ කනිෂ්ඨ සෙබළුන් කිපදෙනකුට ඔහු ඉතා කර්කශ අයුරින් බැන වැදුන අයුරු ඇසීමෙනි. වරක් ඔහු සිටින ස්ථානයෙන් වෙනත් ස්ථානයකට යාමට ඔහුගෙන් අවසර ගෙන ආචාර කළ විටක මා හටද ඔහු තදින් බැන වැදුනේ නිසි පරිදි සිරුවෙන් ඉරියව්වට නොපැමිණි බව පවසමිනි. මා ආයාසයක් ගෙන නිවැරදි ඉරියව්වට පැමිණ නැවත ඔහුට ආචාර කොට එතැනින් නික්ම ගියේ අපගේ පළමු හමුවීම සටහන් කරමින්ය.



මෙසේ කාලය කෙමෙන් ගෙවීගිය අතර අවස්ථා කිහිපයදී මෙන්ම විවිධ පොදු කාර්යයන්වලදී ජයම්පතිගේ රූව දුටුවද කථා බහ කිරීමට කිසිදු අවස්ථාවක් නොවීය. අප හට වව්නියාව රාජකාරී කාලසීමාව අවසන් වී යාපනය අර්ධද්වීපයේ රාජකාරී සඳහා ස්ථානගත වීමට උපදෙස් ලැබී තිබුණ අතර, රිවිරැස ක්‍රියාන්විතයට සහභාගී වීම සඳහා අප වාසවිලාන් කඳවුරට නුදුරින් පිහිටි ඉදිරි ආරක්‍ෂක වළල්ලේ ස්ථානගත විය. එවකට ඒකකයේ විශාල හටපිරිස් සංඛ්‍යාවක් සිටීම හා කණ්ඩායම් වෙන් වෙන් වශයෙන් ඉදිරි ආරක්‍ෂක වළල්ලේ රාජකාරී යෙදීම මත මා ජයම්පති හමුවීමක් එම කාලය තුළ සිදුවූ බව මා හට මතකයට නොනැගේ.

යාපනය ජයග්‍රහනයෙන් පසු අප ස්ථානගත වූයේ අච්චුවේලි ප්‍රදේශයේය. අප අච්චුවේලි කලපුව ඉදිරියේ ආරක්‍ෂක වළල්ල ආරක්‍ෂා කරමින් සිටි අතර, සහෝදර ඒකක තවදුරටත් යාපනය අවට සතුරා සමග සටන් කරමින් යාපනය අර්ධද්වීපයේ යාබද කොටස් අත්පත් කරගැනීමේලා යෙදී සිටියහ. මෙහිදී, ජයම්පති රාජකාරී කළ හට කණ්ඩායම හා මා රාජකාරී කළ හට කණ්ඩායම යාබද වශයෙන් ආරක්‍ෂක වළල්ලේ රාජකාරී කල අතර විවිධ අවස්ථා වලදී අප හමුවී කථා බස් කරන ලදී. ඒ වනවිට ජ්‍යේෂ්ඨයන් අප වෙත ඒකකයට පැමිණි ආරම්භක අවධියේ දැක්වූ රළු හැසිරීම් යම් ප්‍රමාණයකට අඩු වී ගොස් තිබුණි.

එයට හේතුව නම් ඒ වනවිට අප කණ්ඩායමට පසු නවක බඳවාගැනීම් සෙබළ කණ්ඩායම් කිපයක් ඒකකයට එකතු ඇති බැවිනි. නමුත්, වව්නියාව ප්‍රදේශයේදී හමුවුවාට වඩා යාපනය ප්‍රදේශයේ රාජකාරියේදී ඔහු දකින විට යම් කල්පනාහරිතව සිටින බවක් ඔහුගේ පැහැපත් මුහුණේ පැහැදිලිව දක්නට තිබිණි. මා හට එක්වරම සිහිවුනේ එවකට අප අවිවාහකව සිටියද විවාහක දරුවන් සිටින ජයම්පති වැනි අයට එවකට පැවති ගුවන් ගමන් අපහසුතා මත නිවාඩු ලබාගැනීමේ අසීරුතාවයෙන් පෙලෙමින් සිටියා විය හැකි බවය. එහෙත් ඒ බැව් ඔහුගෙන් ඇසීමට තරම් ශක්තියක් මා හට නොතිබුණි.

1995 වර්ෂයේ අගභාගය වනවිට අච්චුවේලි ආරක්‍ෂක වළල්ලේ රාජකාරී ඉතා වෙහෙසකර තත්ත්වයන් අප හට ගෙන දුන් අතර, මෝසම් වර්ෂා

කාලය එළඹීමත් සමඟ අප හට රාජකාරී ඉටුකිරීමට සිදුවූයේ ඉනවටක් ජලයේ සිටය. නමුත්, කාලය ඉතා වේගයෙන් ගතවී යමින් තිබූ අතර අප විසින් තනා ගනිමින් පැවති ආරක්ෂක වළල්ල ශක්තිමත් කරගැනීමේ අති වෙහෙසකර කාර්යයේ යෙදී සිටියදීවත් රාත්‍රියක් උදාවූයේ ඉතා වෙහෙසකර දිවා කාල තත්ත්වකින් පසුවය. අප දිවා කාලයේ එක දිගටම යුද අගල් කපමින් තල්කොට යොදා ආරක්ෂිත බංකර සාදා ගැනීමට උත්සාහ කළත් අවසාන කිරීමට නොහැකි වූ නිසා වැලි ගෝනි කිපයක් ඉදිරිපස ආරක්ෂාවට තබා අප මුර රාජකාරී කිරීමට සූදානම් විය. පවතින තත්ත්වය යටතේ ඉදිරිපසින් පසුපසින් ඕනෑම අවස්ථාවකදී සතුරු ප්‍රහාර එල්ලවිය හැකි බව බණ්ඩහාර සැරයන් විසින් කල් තබා දැනුවත් කර තිබුණි.

මාගේ මුරකුටියේ තිදෙනෙක් වූ අතර මා හට මුරකුටි 5 - 6 ක් දකුණු පසින් ජයම්පති අයත් හට කණ්ඩායම මුරකාවල් යොදා සිටියහ. ඔවුන් කෙසේ හෝ දිවා කාලයේ අප කණ්ඩායමට වඩා ආරක්ෂිත අයුරින් මුරකුටි සාදා තිබූ අතර, අප හට එම තත්ත්වයට ළඟාවීමට නොහැකි වූ නිසා අප සියලුදෙනා කණ්ඩායමේ ජ්‍යේෂ්ඨයන්ගේ දෝෂ දර්ශණයටද ලක්විය. මා රාත්‍රී 10 සිට 12 දක්වා මුර රාජකාරියේ යෙදී සිටි අතර, ඒ නිසාමදෝ සිතට යම් නොසන්සුන් කමක් දැනෙන්නට විය. ඒ ඉදිරි භූමිය නොව පසුපස භූමිය ගැනය. අසාමාන්‍ය ශබ්ද කිහිපයක්ද ඇසුන මුත් ඒ හිතේ අවිශ්වාසය නිසා බැව් කියා මනස සන්සුන් කරගන්නට උත්සාහ කළද අසාර්ථකය.

මා මාගේ ජ්‍යේෂ්ඨයා අවදිකර විස්තරය පැවසීය. ඔහුද පසුවූයේ දිවා කාලයේ අධික වෙහෙසවී ඉතා අපහසුවෙනි. දෙදෙනාම අවදි වී විනාඩි 05 ක් යාමට මත්තෙන් ජයම්පති ඇතුළු හට ස්ථානගත වී ඇති හට කණ්ඩායම ප්‍රදේශයෙන් ඇසුනේ කන් බිහිරි කරවන වෙඩි වරුසාවකි. තුෂ්නිම්භූත වූ අප හට කිසිවක් සිතා ගැනීමට නොහැකි විය. අප හට කණ්ඩායමේ සියලුදෙනා අවදි වී තමා සිටින ස්ථානයන්හි ආරක්ෂාව කඩිනමින් තහවුරු කරනු පෙනුනි. අපගේ නිර්භීත බණ්ඩහාර සැරයන් වහා ක්‍රියාත්මක වී අණදීම ආරම්භ කළේය. සියලුදෙනා තම මුරකටි ආරක්ෂා කරන ලෙසත් සිටින ස්ථාන වෙතින් පසු නොබසින ලෙසත් නියෝග ලැබුණි. නමුත්, මා ඇතුළු අත්දැකීම් අඩු

**එවකට ක්‍රියාත්මක මෙහෙයුම් සමඟ වල්මත් වූ ත්‍රස්තවාදී කණ්ඩායමක් ආරක්ෂක වළල්ල පිටිපසින් පැමිණ මුරකුටියේ සෙබළාට වෙඩි තබා අප විසින් ආරක්ෂා කරන ලද ආරක්ෂක වළල්ල කඩා දමා ඉදිරියට ගොස් තිබිණ. පළමුව තැබූ වෙඩි පහරවල් දරාගත් අප නිර්භීත සෙබළා තනිවම එල්ල කළ වෙඩි පහරවලින් ත්‍රස්තවාදීන් තිදෙනකු එම ස්ථානයේදීම මරාදමා තිබූ අතර, තවත් අයෙක් වෙඩි වැදී මළක් ඉදිරියට ගොස් මැරී වැටී ඇත.**

කිපදෙනකුගේ අවශ්‍යතාවය වූයේ ප්‍රහාරය සිදු වූ ස්ථානය වෙත යාමය. නමුත්, එයට අවසර නොවීය. ප්‍රධාන දෙය ආරක්ෂක වළල්ල රැකගැනීමයි. වෙඩි ප්‍රහාර ප්‍රතිප්‍රහාර රාශියක් සිදු වී පරිසරය නිහඬ විය. එළිය වැටීමත් සමඟ ආරක්ෂක විධිවිධාන තරකර අපද නොඉවසිල්ලෙන් සිදුවීම සිදු වූ ස්ථානයට ගියේ එය සැක හැර දැනගැනීම සඳහාය.

ප්‍රහාරය සිදු වී ඇත්තේ හරියටම අප හට කණ්ඩායම හා ජයම්පතිලාගේ හට කණ්ඩායම වෙන්වන සීමාවේ මුරකුටියකය. එවකට ක්‍රියාත්මක මෙහෙයුම් සමඟ වල්මත් වූ ත්‍රස්තවාදී කණ්ඩායමක් ආරක්ෂක වළල්ල පිටිපසින් පැමිණ එම මුරකුටියේ සිටි සෙබළාට වෙඩි තබා ඉදිරි ආරක්ෂක වළල්ල බිඳගෙන ඉදිරියට යාමය. එහිදී, ඔවුන් ත්‍රස්තවාදීන් වෙඩි තැබූ එම සෙබළාට වෙඩි පහරවල් කිහිපයක් වැදී තිබුණද එම වෙඩි පහරවල් දරාගෙනම ඔහු නිර්භීත ලෙස තනියම එල්ල කළ වෙඩි පහරවලින් ත්‍රස්තවාදීන් තිදෙනකු එම ස්ථානයේදීම මරාදමා තිබීමය.

එහිදී, වෙඩි වැදීම හේතුවෙන් එම සෙබළාද කෑගසමින් සිටියද මුල් අවස්ථාවේ ඒ ආසන්නයේ සිටි කිසිවෙකුත් ඔහුව බේරාගැනීම සඳහා එම ස්ථානයට ළඟා නොවීය. විශේෂයෙන්ම ඇතැම් ජ්‍යේෂ්ඨයින් පවා පසුබා සිටි මොහොතක අප කර්‍ණායක වූ සෙබළ ජයම්පති ඊට සැලකියයුතු දුරක සිටියද එම ස්ථානයට වහා දිවගොස් තුවාල ලැබූ සෙබළා පසුපසට රැගෙන ඒමට ක්‍රියාකළේය. එහිදී, සිදුවූ විශේෂිත සිදුවීම වූයේ ඔහු තුවාල ලත් සෙබළා යයි වටහා ගෙන පළමුව ඔසවා ගෙන තිබුණේ මුර සෙබළා තැබූ වෙඩි පහර වැදී මියගොස් සිටි සතුරු සෙබළකුගේ සිරුරයි. පසුව තමා හට වැරදීමක් වූ බව වටහාගෙන වහාම එම සිරුර පසෙකට දමා ඔහු අප සෙබළා ඔසවාගෙනවිත් කඩිනමින් රෝහල් ගතකිරීමට යොමුකර ඇත. පසුව එලෙස ත්‍රස්තවාදීන් කිහිපදෙනකු විනාශ කරමින් එම කළ සෙබළා මීළඟ නිලයට උසස් කර "රණවික්‍රම" පදක්කමෙන් ද පිදුම් ලැබීය.

නමුත්, ඉහත සිදුවීමේදී ජයම්පතිගේ නිර්භීතභාවය වෙනුවෙන් එතරම් ඇගයීමක් ලැබී නොතිබිණ. මෙලෙස කාලය ගෙවෙද්දී පසු කලෙක මා සමඟම ඔහුද සෙසුනිලයින් අධිකාරියට පත්කිරීමේ පාඨමාලාව හැදෑරීම සඳහා තේරී පත්විය. දියතලාව වෙත ගොස් එම පාඨමාලාව ඉතා සාර්ථකව හැදෑරුවද අධිකාරියට පත්කිරීම සැබැදිව පාලනමය කටයුත්තක් කෙරෙහි යම් සිත් තැවුලක් ඇති කරගෙන සිටි ඔහු නිත්‍යානුකූල නොවන අයුරින් හමුදාව හැරයන ලදී. ඔහුගේ තීරණය වෙනස් කර හමුදාවේ රඳවා ගැනීමට මා පුද්ගලිකව මහත් වෙහෙසක් ගත්තද දැඩි කලකිරීම මත ඔහුගේ තීරණයේ වෙනසක් නොවීම හේතුවෙන් තවත් එක් සැබෑ විරුවෙක් අපට අහිමි විය. එසේම, බොහෝ විට සිදුවන්නා සේම ජයම්පති විසින් තිරය පිටුපස සිදුකළ විරක්‍රියාව කාලයේ වැලි තලාවෙන් වැසීගිය තවත් පදක්කම් නොමැති විරක්‍රියාවකි. නමුත්, ඔහුගේ නිර්භීතභාවය ඒකකයේ සියලුදෙනා මහත් සේ අගය කළ අතර ඔහු සැමගේ ගෞරවාදරයටද පත්විය.



මේජර් ධම්මික කාංචන
නිලධාරී අණදෙන
3(සෙවි) විජයබාහු පාබල
රෙජිමේන්තුව

# හෘද සාක්ෂිය

# විමසා බලන්න



තමා අතින් සිදුවන ඇතැම් බරපතල වැරදි අත්‍යයන්ගෙන් වසන්කර තබා ගැනීමට ඔබ සමත් වන්න පුළුවන. එහෙත් ඒ ක්‍රියාවට එරෙහිව ඔබේ හදවත ඔබට විරුද්ධව තීන්දුවක් දී ඇති බව ඔබ එතරම් ගණනකට නොගන්නවාද විය හැකිය.

මේ තත්ත්වය යටතේ ඔබේ යටි හිතත් බාහිර වශයෙන් ඔබේ ක්‍රියා කලාපය මෙහෙයවන උඩු හිතත් අතර හටගන්නා ගැටුම, මනෝවිද්‍යාත්මක න්‍යායානුකූලව අතිශයින්ම අහිතකරවුත්, කලක් ගතවීමේදී ඔබට වදදෙන සුලු මනෝභාවයක් හටගන්නාවූත් පසුබිමක් සකසන බව හර්බට් ස්පෙන්සර් නමැති මනෝ විද්‍යාඥයා කියයි.

ඔබේ සිරුරට කා වැදීගත් කිසියම් විෂ බීජයක් ප්‍රමාණවත් කාලයක් ගතවන තුරු අක්‍රිය වූවාක් මෙන් තිබී ඔබ නොදැනුවත්ම බලවත් අසනීපයකට දොර විවෘත කර දෙන්නාක් මෙන්, යටි සිතෙහි කාවැදුනු ඔබ වරදකරුවෙකියි යන හැඟීමද නිසංසලේ ක්‍රියාත්මක වෙයි.

මේ වරදකාරී හැඟීම නිතිපතා ඔබ වැරදියි - ඔබ වැරදියි යනුවෙන් ඔබේ හදවතට කොඳුරන විට තව දුරටත් නිහඬව වරද අමතක කරදමා සැනසිල්ලේ පසුවීමට නොහැකි තත්ත්වයක් උදාවෙයි.

මානසික වශයෙන් පමණක් නොව, කායික වශයෙන්ද හිරිහැරදායි එක්තරා අන්දමක චෛතසික සිරකුටියක් තුළ සිරගත වන්නට ඔබට සිදුවන්නේ මෙවැනි අවස්ථාවන්හිදීය.

ඔබ අතින් සිදු වූ වරදට ගොදුරු වූ තැනැත්තා හමුවී කෙලින්ම වරද පිළිගෙන කණගාටුව ප්‍රකාශ කිරීමෙන් ඔබට මේ අසහනයෙන් මිදිය හැකිය. එහෙත් බොහෝවිට සමාජ සම්මත හේතූන් යටතේ එක්වරම එවැනි විවෘත පියවරක් ගැනීමට ඔබ පැකිලෙන්නට පුළුවන. තත්ත්වය එසේ නම් වෙනත් හිතවතකු ලවා හෝ ඒ තැනැත්තාට ඔබ අතින් සිදුවූ වරද ගැන කණගාටුව ප්‍රකාශ කරන්න. ඒ මගින් ඔබ සිත තුළ කාවැදුණු වරදකාරීත්වයේ වැලිකැටය ඉවත් වෙයි.


සොබාදහම තුළින් අපේ චෛතසිකයට ලබාදී ඇති ද්වන්ධ ක්‍රියාකාරීත්වයෙන් එකක් හඳුන්වන්නේ හෘද සාක්ෂි වශයෙනි. හෘද සාක්ෂිය රැවටිය නොහැකි ඊට හරස්ව ක්‍රියා කරන හැම විටම ඉන් ඔබ හරි මගට ගැනීමට හෘද සාක්ෂිය උත්සාහ ගනී.

ඔබට හදිසි කෝපයක් හටගනී. එහි ප්‍රතික්‍රියාවක් වශයෙන් කෝපයට මුල් වූ තැනැත්තාට පහර දෙන්නට ඔබ පෙළඹෙන්නට පුළුවන. එහෙත් මෙහිදී ඔබේ හෘද සාක්ෂිය, නැතිනම් යටි හිත ඔබ ඉන් වළක්වාලීමට කිසියම් ප්‍රයත්නයක් ගන්නා බව ඔබට දැනියයි. බොහෝ විට ඔබ ඒ සංඥාව පිළිගෙන නිහඬ වේ.

ඔබේ එදිනෙදා ජීවිතයට අතිශයින් ප්‍රයෝජනවත් ප්‍රතිපත්තියකට මින් පදනමක් තනාගත හැකිවේ. යම් තීරණයක් ගැනීමට ප්‍රථම ඔබේ හෘද සාක්ෂියෙන් විමසා බලන්න. ප්‍රමාණවත් සදාචාරශීලී බවක් ඔබ තුළ තැන්පත් වී තිබේනම්, නොවරදවාම ඔබට හරි මග හෙළිකරදීමට හෘද සාක්ෂිය ඉදිරිපත්වනු නොඅනුමානය.

මෙය ජීවිතයක සාර්ථකත්වය කෙරෙහි බෙහෙවින්ම බලපාන ගුණාංගයකි. හෘද සාක්ෂිය නොතකා හරින්නා තමා අතින්ම අසාර්ථකත්වය බිහිකරන්නේය යි හර්බට් ස්පෙන්සර් කියයි. වරක් දෙකක් අත්හදා බැලීමෙන් මෙහි ඇති නිරවද්‍යතාව ඔබටම වැටහෙනු ඇත.

1998 ජාතිකි මනාර ඇසුරිනි.




# ඔබේ දරුවාට අහිමිවීම් දරාගැනීමේ ප්‍රථම පාඩම කියා දෙන්න

## මනෝවිද්‍යාත්මක අත්වැලක්

සාර්ථක පුද්ගලයකු ලෙස ලෝකය ඉදිරියේ පෙනී සිටීමට නම් ඔහුගේ හෝ ඇයගේ ළමා කාලය බෙහෙවින්ම බලපාන බව එවකට සිටි මනෝවිද්‍යාඥයකු වූ සිග්මන් ෆ්‍රොයිඩ්ගේ අදහසයි.

මෙහිදී, සාර්ථකත්වය යන්න අප පළමුව අවබෝධ කරගත යුතු කාරණයයි. යමකු මුදල්, එසේත් නැත්නම් උගත්කම, සාර්ථකත්වය ලෙස දැකිය හැක. නමුත්, මේ සියල්ල තිබියදීත් තමා සතු මානසික සමබරතාවය ගිලිහීගොස් තම ජීවිතයෙන් සමුගත් (සියදිවි හානිකර ගැනීම්) අවස්ථා බොහෝ සෙයින් අද සමාජය තුළ අපට දැකිය හැකිය.

එමෙන්ම මානසික සමබරතාවයක් නොමැති එවැනි අයවලුන් නිසා සමහර විට තම ආදරණීය පෙම්වතිය, බිරිඳ, ස්වාමි පුරුෂයා, එසේත් නැත්නම් දරුවන්, යහළුවන් රාජකාරි ස්ථානයේ අනෙකුත් සගයන් ඔහු හෝ ඇය නිසා පීඩා විඳිනවා විය හැක.

කුඩා
කල අප
ජන සමාජයේ මනෝවිද්‍යාව ප්‍රගුණ කලවුන් දක්නට නොලැබුණද මුතුකුරා ගිය දැනුම් සම්භාරයක් සහ අත්දැකීම් සමුදායක් හිමි වැඩිහිටි පිරිසක් සිටියහ. ඔවුන්ගේ කියමන් සහ අවවාදවල සත්‍යතාවය අවබෝධවීමට අපටද වැඩිහිටියන් වන තෙක්ම නොහැකි වූ බව නොරහසකි.

ඉතා සුන්දර වූත් සමබර වූත් ළමා කාලයක් අපට උරුමකර දීම වෙනුවෙන් ඔවුන්ගේ කැපකිරීම අප අගය කළ යුතුය. කුඩා අත දරුවකු වෙනුවෙන් කී නැලවිලි ගීතයක් පවා යම් දරාගැනීමක්, අහිමිවීමක් ගැන මනා ලෙස කියාදුන් අයුරු දැකිය හැකි විය.

දොයි දොයි දොයිය
බබා
නුඹේ අම්මා කිරට ගියා
කිරි අරගෙන එන්න ගියා
කිරි මුට්ටිය ගඟේ ගියා ගඟට
උඩින් කොක්කු ගියා

අත දරුවාට වුවද තමාට හිමි වීමට තිබූ කිරි මුට්ටිය ගඟේ ගියා යන්නෙන් පවසා ඔහුට කුඩා කලම අහිමිවීමේ පාඩම කියාදුන්නා නේද යන්න දැනෙන්නට මොනතරම් කාලයක් ගත වූවාද.

කුඩා කල තම සරුංගලයක් අහස පුරා ලෙලදෙනවා දැකීමෙන් දරුවා සතුටු වෙනවා මෙන්ම එම සරුංගලය දැඩි සුළඟට හසුවී පාවී යද්දී හඬා වැටෙන කිරි දරුවන් අනන්තයි. නමුත්, ඔහුට අහිමිවීමේ පාඩම ඉගෙන ගැනීමට එදා ජන සමාජය මොනතරම් පිටුවහලක් වූවාද යන්න නොරහසකි.


සෙල්ලම් ගෙදරක බත් පතක් ඉදීම, සතුටින් ගතකිරීම වැනි දෑ තුළින්

පවුල තුළ සාමයෙන් ගත කිරීමට ප්‍රායෝගික පුහුණුවක් ලබාදුන් බව හැඟෙන සෑම මොහොතකම සිත සතුටින් පිරීයන වාර අනන්තයි.

## නූතන සමාජයේ දරුවා

පහ වසර ශිෂ්‍යත්ව විභාගයට නොතේරෙන දවසේ සිටම දෙමාපියන් විසින් දරුවන් පුහුණු කරමින් තරඟයට හුරු කරමින් සිටී. අනෙකා පරයා යන්න සෑමවිටම උපදෙස් ලබාදෙයි. කරුණාව දයාව හුරුවීමට දරුවන් සමඟ කෙළිදෙලෙන් ගතකිරීමට ලැබෙන අවස්ථා අල්පවෙමින් පවතී.

ගුණධර්ම, සෙනෙහස කියාදීමට දෙමාපියන්ට කාලය සහ රැකියාවන් හරස් වී ඇත. සරුංගලයක් අත දරාගෙන හිස් අහසේ ලෙලදෙන විට ඔහුට උදම් වන්නටත් එය ගිලිහී ගිය පසු බිම පෙරලී අඬන්නටත් අවස්ථාවක් ලබාදීමට තරම් දෙමව්පියන් යුහුසුළු වන්නේද නැත.




මේ අකුරු අතර සැරිසරණ විට ඔබ අතින් ගිලිහී ගිය දෑ නිසා ඔබේ දරුවාගේ ළමා කාලය සුන්දර වූත් අර්ථවත් වූත් එකක් කිරීමට නොහැකි වූ මවක හෝ පියකු නම් චිත්‍රපටයක් නරඹන්නකු ලෙස එකින් එක ඔබේ මනසේ ඇඳී මැවෙනු ඇත. ඔබ හදවතක් ඇත්තෙක් නම් හෙට ද ඔබ ප්‍රමාද නැත.

වරක් මා මිත්‍රයකු ඔහු විසින් තම දඟකාර කුඩා දරුවා අධ්‍යාපනයට හුරු කිරීමට අපූරු දෙයක් කළ බවත් එමනිසා ඔහු සම්පූර්ණයෙන්ම වෙනස් පුද්ගලයකු වූ බවත් මා සමඟ පවසා සිටියේය. ඔවුන් දෙදෙනා නගරයේ සැරිසරන අතරවාරයේ සිඟමන් යදිමින් සිටි යාචකයකු හමු වූ බවත් තම කුඩා දරුවා බලා සිටියදී ඔහු මුදල් ලබා දුන්නේ මන්ද යැයි ප්‍රශ්ණ කිරීමේදී ඔහු පවසා ඇත්තේ ඔහු කුඩාකළ ඉගෙනුමට මැලිකම් දැක්වීම නිසා හොඳ රැකියාවක් දැන් නොමැති බවත් මේ වනවිට ඔහුගේ දෙමව්පියන් මහළුවියේ බැවින් ඔහුට සෑම පුද්ගලයකුගෙන්ම සිඟමන් යැදීමට සිදුවී ඇති බවත්ය. මා මිත්‍රයාගේ කුඩා දරුවාගේ සිතට මෙය මහමෙරක් මෙන් කා වැදී මේ වනවිට ඔහු වෑඩිහිටියකු මෙන්ම හොඳ අධ්‍යාපනයක් සහ ගුණධර්මවලින් පිරි සමාජයට වැඩදායී පුද්ගලයකු වී හමාරය.



සටහන :-
කර්නල් හේමන්ත රත්නායක
(මනෝවිද්‍යා උපදේශක)
දුරකථන : 0711920120
hemantharathnayake20gr@gmail.com

## දැනුම ලැබුමට කෙටි මඟක්



ග්‍රීක මහා දාර්ශනික සොක්‍රටීස් වෙත එළැඹි තරුණයෙක් දැනුම ලබාගන්නා හැටි තමාට කියා දෙන්නැයි ඔහුගෙන් ඉල්ලා සිටියේය. විලක් වෙත තරුණයා කැඳවා ගෙන ගිය සොක්‍රටීස් ඔහුගේ බෙල්ලෙන් අල්ලා පාත්කොට හිස දියෙහි ඔබාගෙන සිටියේය. හුස්ම ගැනීමට නොහැකිව දඟලන්නට වූ තරුණයා ආපසු ඉවුරට ඇදගෙන ආ සොක්‍රටීස් ඔහුගෙන් මෙසේ ඇසීය.

ඔබේ හිස දියයට තිබියදී ඔබට වැඩියෙන්ම වුවමනා කළ දෙය කුමක්ද?

වාතය ! යි තරුණයා පිළිතුරු දුන්නේය.

"එහෙනම් දැන් යන අතට යන්න පලයන්. දියෙහි ගිලී සිටියදී ඔබට වාතය අවශ්‍ය වූ අන්දමේ වුවමනාවක් ඇති වූ විට දැනුමද ඔබට ලැබෙනවා සිකුරුයි" යනුවෙන් සොක්‍රටීස් තරුණයා අමතා කීය.



# සෙබළ සිතුවිලි

## අම්මේ ඔබට තුන් සරණයි ...

මගේ ලොවට එළිය දුන් අම්මා
තුන් සරණින් මා සැනසූ අම්මා
කිරට හඬන මට කිරි දුන් අම්මා
තුන් සරණින් මා නැළවූ අම්මා

වැටි වැටී නැගිටින්නට අතදුන් අම්මා
තුන් සරණේ පිහිට පැතූ අම්මා
දුක සැප දියුණුව දැක කඳුලු සැලූ අම්මා
තුන් සරණින් මා නැළවූ අම්මා

බහ තෝරන මට අකුරු කියූ අම්මා
තුන් සරණින් ලොවම කියාදුන් අම්මා
සොඳුරු ලොවක මඟ හෙළිකළ අම්මා
මෙත් මුදිතා කරුණා ගුණයයි අම්මා

ලොව්තුරු දහමේ අරුත කියාදුන් අම්මා
නිවන් මගට මඟ හෙළිකළ අම්මා
පුතු වෙනුවෙන් පාරමිතා පිරූ අම්මා
නිවන් දකින්නට වරම් දුන් අම්මා

නිවන් දකින්නට පාර කියම් අම්මා
නිවන් දකින තුරු පිහිටට එම් අම්මා
පිරූ පාරමී ගුණ බල මහිමෙන් අම්මා
නිවන් දකින්නට කාලෙ මෙයයි අම්මා

සසර දුක් නිවා නිවන් දකින්න අම්මා
සසර දුකින් මිදී නිවනට යයි පුතු අම්මා
සසර සැරූ බැම් අවසන් වෙයි අම්මා
සඳා සොඳුරු නිවනේ සැනසෙමු අම්මා

සසරේ මෙතුවක් විඳි දුක් අපමණයි අම්මේ
තුන් සරණේ ගුණ හිමක් නැහැ අම්මේ
ලොව්තුරා බුදු ගුණ අනන්තයි අම්මේ
බුදු පාමුල පිදූ පියුමක් සේ අම්මේ

සිවිල් අජන්ත හේරත්
අයවැය හා මූපඅම

## මුළු ලොව ඔබයි අම්මා...

හිරු ලොවට එබෙන සඳ
අවදිවෙයි ඈ සැණින
සියලු දුක් සිත දරා
මුව සිනා පතුරගෙන
ඈ ගෙවන හැම දිනම
මගේ සතුටම පතන
වෙන කෙනකු නොවේ ඒ
රැජිනියයි ඔබ මෙමට
අම්මා නම් ඔබයි
ලොව කිසිම කෙනකුට
කිසිදාක සම නොවන

සෙ/21ඕ00470
කෝප්‍රල් පතිරණ පිවන්ජ්
17(සෙව) ශ්‍රීලපාහ

## අවවාදය සමඟ පෙරට යන්න...

තම මිතුරන් හට සමාජයේ හොඳ
පුරුදු කියාදෙන්න
තමන්ද ඔවුන් හට
ආදර්ශයක් ලෙස
කටයුතු කරන්න
තම අනුගාමිකයින් හට
නිවැරදි දේ පමණක් කියාදෙන්න
එවිට ඔබට හැකිවේවි
ඔබගේ අරමුණු සතුටින්
ජයගන්න

සෙ/321866
ලා/කෝ මදුශංඛ කේශූ
10 ශ්‍රීලපාහ

## ආදරයේ සංවේදීත්වය...

සෙනෙහසේ බැඳීම්වල
සංවේදීත්වය මම දැනගෙන හිටියෙ නැහැ
නමුත්, නුඹේ ආදරය
මගේ ජීවිතය අද්දරට ඇවිත් සිනාසෙද්දී
නුඹ මගේ යසෝධරාවයි මම හිතුවේ

සෙ/2ඕ03197
ලා/කෝ දයාරත්න ඩීවී
2 ශ්‍රීලපාහ

## ජීවිතයට ඔවදනක්...

ඔබගේ ජීවිතයේ මාන්නය අත් හරින්න
ඉවසීම පුරුදු පුහුණු කරගන්න
ඔබගේ සිනහව රැක ගැනීමට
උත්සහ කරන්න
කේලම් කීම මගහරින්න
සාර්ථකත්වය වෙත ලඟාවෙන්න
ඉරිසියාව නමැති පර්වතය දුරස් කරන්න
දැනුම නමැති ධනය එකතු කරගන්න
තරහව අඩු කරන්න
විශ්වාසය රැකගන්න
ආදරයට ආදරය කරන්න
මනුස්සකම නමැති ජල කඳ පතුරවන්න
ජීවිතය විඳගන්න
එවිට ජීවිතයේ සාර්ථකත්වය නමැති
පාලමින් ගොඩවීමට
අපට හැකිවනු නොඅනුමානයි

සෙ/එෆ්101146
ලා/කෝ විරරත්න ජීජීවඑඩීටී
3(සෙව) ගැහේබ

## උඹට හිමි නැති වෙසක් සඳ...

හැම තැනම සද්දෙට වෙසක් බැති ගී
බෞද්ධ කොඩි ලෙලදෙන්නේ සුළඟත් එක්ක තරඟෙට
වෙසක් දන්සැල්, වෙසක් බැති ගී, වෙසක් කළාප
ලියලා තියෙනවා කඳවුර වටේටම
කොල්ලො කෙල්ලෝ දන්සැල්වල පෝලිමේ
අපේ අය කූඩු හදන්නේ, සරසන්නේ තරඟෙට
ඒ අස්සේ දෙන්නෙක් කථා වෙනවා හෙමිහිට
"යුද්දෙත් ඉවරයි" ආමි එකට වැඩක් නෑනෙ දැන්
කියාගෙන යන ගමන් බලන්න වෙසක්
කමක් නෑ මචං පලයන් බලන්න වෙසක්
අපි ඉන්නවා උඹලගෙ තනියට උඹලා ගෙදර යනකල්
ඒ අස්සේ ඇහෙන්නේ රින්ග් වෙන සද්දෙ දුරකථනේ
බැලුවම තමයි දැක්කේ කෝල් එක නෝනාගෙන්
ළමයි කියනවලු ඕනෑ හදන්න බුදුරැස් වළලු, අටපට්ටම්
කියනවලු මටත් යන්න ඕනෙ වඳින්න දන්සැල්
කොහොමද මං ඕවට යන්නේ පොඩි එකත් එක්ක
නෝනා කියන්නේ ඝාංධාර සද්දෙන්
කමක් නැහැ පුතේ ඉවසන් හිටපන් තව වසරක්
එදා වගේම අදත් උඹයි මමයි දෙන්නම කැපකළේ
රටේ උන්ගේ වෙසක් වෙනුවෙන්
ප්‍රාර්ථනා කරපන් උඹත් අම්මා එක්ක
පත්තු කරලා බුදුන්ට පහනක්
ලබන පාර වත් තාත්තා එක්ක බලන්න යන්න වෙසක්

හි/10857
ලුතිනන් එච්ආර්එන්සී පීරිස් - ගැජේබ

## මටත් හුස්මක් ලැබේවා...

පෙර පිනකි සැනසුමකි මට ඔබෙ ලෙයින් ඉපදීම
හිමිකමකි දියණි වී වැඩිපුරම ආදරෙ ලද
මවට පෙර සියලු දේ පැවසුවේ මා ඔබ හට
පියෙකු පමණක් නොවෙයි; දෙවියෙකි ඔබ මට

ලොවට බිහිවූ දා පටන් පළමු දරු මං වී
අද නොවෙයි හෙටකටත් එදා මෙන් දරු වී
පවසන්නෙ හිතින් ඔබ ප්‍රාණෝ මං නුඹේ වී
දිනෙන් දින ලැබේවා සුව සවිය දැඩි වී

වෙහෙස වී ඇතත් ගත දරන්නෙ නුඹ අපි නිසා
සැදෑ සමයයි ගෙවෙන්නෙ තවත් කය වෙහෙසුවත් මෙදා
දිනෙක ඔබ සුවසිතින් නිදහසින් පසු වන්නේ කෙසේ
ඇත්තමයි, හිත නිදහසින්, මා තුටින් හිනැහෙන්නේ එදා

නොහැක ගෙවනට දරන බර නුඹ උහුලන්න මට කෙදිනවත්
මේ දිවිය මදි මට වන්දි ගෙවනට සදාකල් නුඹෙ නාමයෙන්
නමුදු පියතුම හැකි දේ කරනෙමි නොපැතුවත් කිසිවක් මගෙන්
පල නොදැරුවත් ගස් මගේ නුඹ නිතින් පවසන අදහසින්

ඉතිං පතනෙමි දිනෙන් දින ඔබ සුවය ශක්තිය ලැබේවා
හිතින් වත් හිත නොරිද ඔබගේ සතුට නිතිකල් දිනේවා
අහස් ගව්වට පයින් යන කල් දීර්ඝායු ලැබේවා
මතුත් මතුවක නුඹෙ දියණි වී මටත් හුස්මක් ලැබේවා

සෙ/ඕ103622 කාසෙ රෙපිනෝල්ඩ් එන්ඩී
පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය

## සසර මඟ...

කිම මේ සසර තුළ
නොහික්මුනු
නොසන් සිඳෙන
පැතුම් පොදි බැඳගත්
විඩාපත් ජීවිත

දිනෙන් දින
බැඳීම් මත වේදනා
ජීවිත නිස්සාර බව

අත්හරින බව සිතා
මම මගේ කරගත්
සියල්ලම යම් දිනෙක

රැස් කරන්නට හැකි නම්
කුසල් දම්
රැගෙන යන්නට හැකිය
මිනු ලොව සසර අවසන
දක්වාම

සෙ/47922
කෝප්‍රල් කුලරත්න පීආර්පී
16 ගරෙ

## මගේ අම්මා...

සතුටු සයුර මත කඳුළු කැට ඇතත්
ගැඹුරු දිය පතුල දුක් සෝ සුසුම් ඇතත්
සැඟවුණු සිනා පැතිරුණු ගඟුල
මවයි ඔබ මගේ මුළු ලොව පුරා
නිසලව ගලායන සිත පතුලෙන්
දරු සෙනෙහස ඉතිරූ
මා වෙනුවෙන් හෙලූ දහඩිය මත
මම ඔබේ පුතුය දැනුන
මැණියනි මතු දිවි ඇති තුරා
ඔබයි මගේ අම්මා

සෙ/167242
තුසෙ හේරත් අයිඩීසීපී

## අත් නොහැරී ප්‍රේමය...

නුඹේ සිනා හඬ
පැවසිය නැහෙන හදවත
ලදිමි මා නුඹෙන් අපමණ සුවය
අවසර නොදී හදවතට ලැබ
නොලැබූ ආදරය අත්හැරුණු ප්‍රේමය...

සෙ/2100815
සැරයන් චතුර කුමාර පීපීවන්
2(සෙච්) ශ්‍රීලයුවෙබ

## පුතුණී මගේ...

සුව පහසුද පුතුණී නොදනිමි ගැබෙහි මගේ
සෙනෙහස ගිඟුම් දෙනවා නිරතුරුම හදේ
දකින දවස ලඟ එන බව දැනෙමි ඔබේ
ඔබ ගැන බයක් දැනෙනවා මැණික මගේ

ආසයි සිහිඳු මුව සිඹිමින් නලවන්න
පිවිතුරු සුවඳ සුව යහනක සතපන්න
ආදර මිතුරු මනුසත්කම් හොබවන්න
ඔබ මේ ලොවට හොඳ මිනිසෙක් කරවන්න

කටුකයි රළුයි විෂමයි ලොව දසත අනේ
නොහැකි නොගැලපෙයි දැන්නම් ඔබට පුතේ
පාපොඩි තියන්නට ලස්සන ලොවක් නැතේ
කුමක් කරන්නද මං අසරණයි පුතේ

සෙ/373783
සැරයන් උමේෂ් කුමාර ආර්සී
8 ශ්‍රීලංසිරෙ

# ‘2nd Belt & Road Athletic Invitation Meet’



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ මාණ්ඩලික සැරයන් එස්.ඒ. දර්ශන චීනයේ පැවති 2024 *‘2nd Belt & Road Athletic Invitation Meet’* තරඟාවලියේ මීටර් 400 ධාවන ඉසව්ව තත්පර 45.48 ක කාලසීමාවක් තුළ අවසන් කරමින් ප්‍රථම ස්ථානය දිනාගත්තේය. ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වීමට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 48 දෙනකු සුදුසුකම් ලබන අතර සිය දක්ෂතාවයන් තුළින් පැරිසියේ ශ්‍රේණිගත කිරීමේ තරඟාවලියේ 51 වන ස්ථානය හිමිකරගැනීමට මාණ්ඩලික සැරයන් දර්ශන එස්ඒ සමත්විය.




## ජාතික බොක්සිං ශූරතාවලිය - 2024 තරඟාවලියේදී යුද්ධ හමුදාවට ජයග්‍රහණ රැසක්

“ජාතික බොක්සිං ශූරතාවලිය - 2024” තරඟාවලිය කොළඹ රාජකීය විද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් මැයි මස 12 වන දින සිට 16 වන දින දක්වා පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි බොක්සිං කණ්ඩායම මෙම තරඟාවලියේදී සිය දක්ෂතා විදහා දක්වමින් රන් පදක්කම් 14 ක්, රිදී පදක්කම් 07 ක් සහ ලෝකඩ පදක්කම් 06 ක් දිනාගැනීමට සමත්විය.









# ජාතික බේස්බෝල් සුපර් ලීග් - 2024








National Baseball Super League - 2024 තරගාවලිය පසුගිය මැයි මස 11 වන දින දියගම බේස්බෝල් ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. එහිදී, ශ්‍රී ලංකා නාවික හමුදා පිරිමි බේස්බෝල් කණ්ඩායම පරදවා ලකුණු 3-4 ක් ලෙස යුද්ධ හමුදා බේස්බෝල් කණ්ඩායම ජයග්‍රහණය හිමිකරගනු ලැබීය. යුද්ධ හමුදා බේස්බෝල් කමිටුවේ සභාපති 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ඒසී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා පිරිමි බේස්බෝල් කණ්ඩායම මාස තුනක පමණ විශේෂ පුහුණුවකින් පසු මෙම තරගාවලිය සඳහා සහභාගී කරවනු ලැබීය.

## උගන්ඩා ජාතික ක්‍රිකට් කණ්ඩායමට එරෙහිව යුද්ධ හමුදාවට ජයක්

උගන්ඩා ජාතික ක්‍රිකට් කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රිකට් කණ්ඩායම අතර පනාගොඩ, යුද්ධ හමුදා ක්‍රීඩාංගණයේදී ඉකුත් මැයි මස 07 වන දින පැවති පළමු විස්සයි විස්ස ක්‍රිකට් තරගයේ ජය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායමට හිමිවිය. එහිදී උගන්ඩා ජාතික කණ්ඩායම ලකුණු 111 කට සීමා කරමින් යුද්ධ හමුදා පන්දු යවන්නෝ සිය අණසක පැතිරවූහ. පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ යුද්ධ හමුදා ක්‍රිකට් කණ්ඩායම කඩුලු 5 ක් දැවී ලකුණු 116 ක් ලබා ගනිමින් කඩුලු 5ක පහසු ජයක් අත්කර ගත්තේය.



# සේපැක්ටැක්රෝ තරඟාවලියෙන් ජයග්‍රහණ රැසක්



ශ්‍රී ලංකා ජාතික සේපැක්ටැක්රෝ සංගමය විසින් සංවිධානය කරන ලද ජාතික සේපැක්ටැක්රෝ හූප් *(Hoop)* හා සෝලෝ *(Solo)* පන්දු තරඟාවලිය සඳහා සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශිෂ්ට දක්ෂතාවයන් දැක්වීමට සමත්වූහ.

එහිදී, යුද්ධ හමුදා පිරිමි *A* කණ්ඩායම හූප් *(Hoop)* තරඟ ඉසව්වේ ශූරතාවයත්, යුද්ධ හමුදා කාන්තා *A* කණ්ඩායම හූප් *(Hoop)* තරඟ ඉසව්වේ ශූරතාවයත්, යුද්ධ හමුදා කාන්තා *B* කණ්ඩායම හූප් *(Hoop)* තරඟ ඉසව්වේ අනුශූරතාවයත්, යුද්ධ හමුදා පිරිමි *B* කණ්ඩායම හූප් *(Hoop)* තරඟ ඉසව්වේ තුන්වන ස්ථානයත් හිමිකර ගන්නා ලදී.

කාන්තා සෝලෝ *(Solo)* පන්දු තරඟාවලියේ ප්‍රථම ස්ථානය යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් ගමපතිරණ එස් සහ පිරිමි සෝලෝ *(Solo)* පන්දු තරඟාවලියේ දෙවන ස්ථානය යුද්ධ හමුදා සේවා බලකායේ කෝප්‍රල් සොයිසා ඩබ්ලිව්ඩී දිනාගත්හ. යුද්ධ හමුදා සේපැක්ටැක්රෝ කමිටුවෙහි සභාපති බ්‍රිගේඩියර් කේඒයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම සංචිතය ක්‍රියාත්මක වේ.

## අන්තර් ඒකක එල්ලේ තරඟාවලිය - 2024








7 (සෙව්) සන්නාහ සන්නද්ධ බලකාය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා "අන්තර් ඒකක එල්ලේ තරඟාවලිය - 2024" ඉකුත් අප්‍රේල් මස 24 සහ 25 යන දිනයන්හිදී කැකිරාව, තිබ්බටුවැව විද්‍යාර්ථ විද්‍යාලයේදී පැවැත්විණ. එහිදී, 3 සන්නාහ සන්නද්ධ බලකාය තරඟාවලියේ ජයග්‍රහණය හිමිකර ගත්තේය. එහි අනුශූරතාවය 5 සන්නාහ සන්නද්ධ බලකාය හිමිකර ගත් අතර, තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස 3 සන්නාහ සන්නද්ධ බලකායේ ආධුනික සෙබළ ලක්ෂිත එම්එස් සම්මාන හිමිකර ගත්තේය. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සන්නද්ධ බලකා පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක කර්නල් ඒඑච්ආර් හසන්ත ආර්එස්පී පීඑස්සී සහභාගී විය.

# ජාතික කරාතේ ශූරතාවලියේදී ජයග්‍රහණය රැසක්



ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය මගින් සංවිධානය කරන ලද ජාතික කරාතේ ශූරතාවලිය ඉකුත් අප්‍රේල් මස 27 වන දින සිට 29 වන දින දක්වා බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කරාතේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් මත යුද්ධ හමුදා ක්‍රීඩකයෝ මෙම තරඟාවලියට සහභාගී වූහ. එහිදී, ඔවුන් විවිධ කාණ්ඩ ඔස්සේ රන් පදක්කම් 08 ක්, රිදී පදක්කම් 05 ක් සහ ලෝකඩ පදක්කම් 15 ක් දිනාගනිමින් සුවිශේෂී දස්කම් දැක්වූහ.




# අන්තර් ඒකක කබඩි තරඟාවලිය

56 වන පාබල සේනාංක බලප්‍රදේශයේ ස්ථාපිත බලසේනා සහ ඒකකයන්හි සහභාගීත්වයෙන් කබඩි තරඟාවලියක් පසුගිය මැයි මස 14 වන දින 16 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එහි අවසන් මහ තරඟය සඳහා 16 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සහ 11 ගැමුණු හේවා බළඇණිය සුදුසුකම් ලැබූ අතර, එයින් 16 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ජයග්‍රහණය හිමිකරගනු ලැබීය.



56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති අවසන් මහ තරඟය නැරඹීම සඳහා නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.





# රණවිරුවා



'*Ride with Pride*' පාපැදි සවාරිය ඉකුත් අප්‍රේල් 28 වන දින ගාලුමුවදොර පිටියෙන් ආරම්භ වූ අතර යුද්ධ හමුදා නිලධාරීන්ගේ සහ සෙසුනිලයන්ගේ අත්පොලසන් හඬ මධ්‍යයේ එය ඉකුත් මැයි මස 11 වන දින කිලෝමීටර් 1247 ක දුර ගෙවා ගාලුමුවදොර පිටියේදී සාර්ථකව අවසන් විය.

මේජර් ජෙනරාල් එස්ආර් බාලසූරිය (විශ්‍රාමික), මේජර් ජෙනරාල් කේපීඑස් ප්‍රේමලාල් (විශ්‍රාමික) සහ කර්නල් ඩබ්ලිව්එන්පීඑස්කේ පෙරේරා (විශ්‍රාමික) යන යුද්ධ හමුදා ප්‍රවීණයන් තිදෙනාගේ සහභාගීත්වයෙන් ගාලු මුවදොර පිටියෙන් ඇරඹි මෙම පාපැදි සවාරිය කල්පිටිය, පුනරීන්, කන්කසන්තුරේ, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, පොතුවිල්, කතරගම, තංගල්ල සහ අලුත්ගම ඔස්සේ ගමන් කර නැවත ගාලු මුවදොර පිටියෙන් සමාප්ත විය. '*Ride with Pride*' පාපැදි සවාරියේ ධාවකයින් දිරිමත් කිරීමේ අරමුණින් පාපැදි ධාවකයන්ගේ රෙජිමේන්තුවලට අයත් සේවයේ නියුතු සහ විශ්‍රාමික සාමාජිකයෝ රැසක් ද ඊට එක්වූහ.









**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කෙව්චන රසික කුමාර
එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ජීවීඑච ද සා
ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ නවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 ඔනි II සේනාරත්න ජීසී 3 ඉංජිනේරු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉංජිනේරු

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිලුව**


51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය




# සයුරින් එතෙරට ගිය රණවිරු අභිමානය...

ජපානයේ පැවති කෝබේ 2024 පැරා මලල ක්‍රීඩා ලෝක ශූරතාවලියේදී පැරා හෙල්ල විසිකිරීම *F*- 44 කාණ්ඩයේ ලෝක වාර්තාවක් (දුර මීටර් 66.49) පිහිටුවීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බලලත් නිලධාරී II කෝප් සමිත දුලාන් සමත්විය.

එහිදී, ඔහු එම ඉසව්වෙන් (*F-44/-64*) රිදී පදක්කම දිනාගත් අතර, ඔහු නියෝජනය කරන කාණ්ඩයෙන් (*F-44*) ලෝක වාර්තාවක් ද පිහිටුවීය. රණ බිමේදී සේම කෙළි බිමේදී ලක් විරුවකු ලෙස ඔහු පෑ හපන්කමට "රණවිරුවා" ද මෙලෙස උත්තමාචාරය පුදනු ලබයි.








රණබිමේ මතක

## නිදොස් කොට
## නිදහස් කළ මාතෘ භූමියේ

# 15 වසක් සපිරුණු

## විජයග්‍රහණයේ සැමරුම

2009 - 2024

යුද්දෙට ගිය රණවිරුවො
පොරොන්දු දෙකක් වුණා.
එකක්, මේ රට ත්‍රස්තවාදීන්ගෙන්
නිසැකවම මුදාගන්නා බව.
දෙවැන්න, යුද්දෙ නිමකරල
නොවරදවාම ගෙදර එන බව.
නමුත්, පළමු පොරොන්දුව
ඔවුන් හරියට ඉටුකළත්
වැඩි දෙනකුට
ඒ දෙවෙනි පොරොන්දුව
ඉටුකරන්න ඉඩක් ලැබුණෙ නැහැ.
එහෙම ගෙදර නොආව
බොහෝ දෙනෙක්
අදත් ඒ සටන්බිමේ
පස් අතර මිහිදන්ව ඉන්නවා.
15 වසක් සපිරුණු
මේ ඓතිහාසික විජයග්‍රාහී දිනයේ
ගැඹුරු හුස්මක් අරන්
ඒ විරුවන් සිහිකරන්න
අමතක කරන්න එපා.
ඔවුන් ඉතිරිකළේ
මේ රට විතරක් නෙවෙයි
අනාගත පරපුරට
ජීවිතයකුත් ඉතුරු කළා...

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.